වාර්ෂික වාර්තාව - 2021

විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය,

එම්.ඩී.එච්. ජයවර්ධන මාවත,

අතුරුගිරිය.

දු.අංකය : 011-2770232

ෆැක්ස් : 011-2798775

විද්‍යුත්තැපෑල: nipm1979@gmail.com

වෙබ් : www.nipm.gov.lk

DO/ACC/02

පටුන

දැක්ම හා මෙහෙවර ප්‍රකාශය	02
සභාපතිතුමාගේ පණිවිඩය	03
අධ්‍යක්ෂකගේ සමාලෝචනය	04-08
ආයතනය පිහිටුවීම සහ එහි අරමුණු	09-10
පාලක මණ්ඩලයේ විෂය පථය	11-12
විගණන සහ කළමනාකරණ කමිටුවේ විෂය පථය	12-13
ආයතනයේ කාර්ය මණ්ඩලය	14-17
පාලන අංශය පිළිබඳ සමාලෝචනය	18
සංවිධානාත්මක ව්‍යුහය	19
ආයතනයේ ප්‍රධාන පුහුණු වැඩසටහන්	20-23
වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය	24-34
වෙනත් සංවිධාන සඳහා විභාග පැවැත්වීම	34-36
වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යා උපාධිය	36
ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය	37
ආයතනය සතු පහසුකම්	38-40
මූල්‍ය සමාලෝචනය	41-45
ආයතනය මුහුණ දෙන අභියෝග	46
කාර්යසාධනය ඉහල නැංවීම සඳහා මධ්‍ය කාලීන උපාය මාර්ග	47
නිගමනය	47-48
මූල්‍ය වාර්තා	51-99
විගණකාධිපති වාර්තාව	100-109

දැක්ම

වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව හා උපදේශන සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ට ආයතනය බවට පත්වීම

මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුළින් කර්මාන්තයේ සියලුම මානව වත්කම්හි වෘත්තීය නිපුණතාව පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම

සභාපතිතුමාගේ පණිවිඩය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ **2021** වාර්ෂික වාර්තාව වෙනුවෙන් එහි වර්තමාන සභාපතිවරයා ලෙස පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ හද පිරි සතුටිනි.

ඕනෑම සංවිධානයක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ සම්පත්වලින් සමන්විත වීම ඉතා වැදගත් වේ. මෙම විවිධ සම්පත් අතර ඇති එකම සජීවී සම්පත මානව සම්පත වන අතර සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා මානව සම්පත ඉතා වැදගත් වේ. එයට හේතුව අනෙකුත් සියලුම සම්පත් සමූහය මෙහෙයවනු ලබන්නේ මානව සම්පත විසින් වන බැවිනි. පුළුල් අර්ථයකින් ගත් කළ, දැනුම හුවමාරු කර ගැනීම, නිපුණතා වැඩි දියුණු කිරීම සහ ධනාත්මක ව සිතීමේ ක්‍රමවේදයන් ප්‍රගුණ කිරීමට මග පෙන්වීම මානව සම්පත් සංවර්ධනයේ දී සිදු කරනු ලැබේ.

2021 වර්ෂය දෙස ආපසු හැරී බලන විට, වැවිලි කර්මාන්තය අභියෝග රැසකට මුහුණ දුන් වර්ෂයක් ලෙස සැලකිය හැකි ය. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම, ශ්‍රම ආකර්ෂණය නොමැතිකම හා කෝවිඩ් - **19** වසංගත තත්ත්වය හේතුවෙන් ලොව ආර්ථිකයට සිදු වූ බලපෑම වැවිලි කර්මාන්තය මුහුණ දුන් අභියෝග අතර ප්‍රධාන වේ. ඉහත සඳහන් අභියෝග ජය ගැනීම උදෙසා වැවිලි ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය පිණිස විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ වගකීම අපි භාර ගත්තෙමු. එහි ප්‍රගතිය සම්බන්ධයෙන් මෙම කාර්යසාධන වාර්තාව සාක්ෂි දරනු ඇත.

ආයතනය ඉහළ කාර්ය සාධන මට්ටමකට රැගෙන ඒමට මඟ පෙන්වූ ගරු වැවිලි අමාත්‍ය, වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ද, සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය, කනක හේරත් මැතිතුමා ද, වැවිලි අමාත්‍යාංශ ලේකම්, රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා ද සමාගම් වතු ප්‍රතිසංස්කරණ තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා, තේ හා රබර් කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශ ලේකම්, ජේ. එම්. තිලකරත්න බණ්ඩා මහතා ද වැවිලි අමාත්‍යාංශයේ සහ වැවිලි රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සියලුම දෙනා ද මේ අවස්ථාවේ දී ගෞරව පූර්වකව සිහිපත් කරමි.

ආයතනයේ පාලක මණ්ඩලය සහ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි, ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය විසින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තම වෙහෙස මහන්සිය නොබලා දක්වනු ලැබූ දායකත්වය වෙනුවෙන් ද මාගේ ස්තුතිය පළ කර සිටිමි.

ඒ. එල්. ඒ. අසෝක සිරිවර්ධන
සභාපති
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

2022.04.20

අධ්‍යක්ෂකගේ සමාලෝචනය

පසුගිය අධ්‍යයන වර්ෂය තුළ දී අධ්‍යයන සහ වෘත්තීය ප්‍රයත්නයන් තුළින් දැඩි කැපවීමකින් සාක්ෂාත් කර ගත් විශිෂ්ටත්වය හමුවේ, අප ආයතනය විසින් අත්පත් කර ගත් කැපී පෙනෙන ජයග්‍රහණ කිහිපයක් ඉදිරිපත් කිරීමට මම මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි. ඒ අනුව, ආයතනයේ 2021 අධ්‍යයන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව නිකුත් කිරීම පිළිබඳව සතුටු වන අතර කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුව ද අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්, ජයග්‍රහණ, මුලපිරීම් සහ නව සාමාන්‍ය තත්ත්වය සමඟ ආයතනයේ අනාගත සැලසුම් පිළිබඳ විශේෂ අවස්ථා ඔබ සමඟ බෙදා ගැනීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙමි.

වසංගත තත්ත්වය හමුවේ ඉදිරිය කරා පියනැගීම

කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුව, අපි අපගේ අධ්‍යයන විශිෂ්ටත්වය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ දී සාක්ෂාත් කර ගත් අතර කාබනික කෘෂිකර්මය සහ වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව සහ තේ රස පරීක්ෂාව පිළිබඳ උසස් පාඨමාලා ද ඇතුළුව 2021 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සහභාගිත්වයෙන් වැවිලි කර්මාන්තයට අනුබද්ධිත වැඩසටහන් ගණනාවක් සකස් කර ප්‍රකාශයට පත් කළෙමු.

ISO 9001:2015 ප්‍රමිතීන්ට අනුකූල වෙමින්, 2021 අධ්‍යයන වර්ෂය තුළ දී, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5-6 පදනම් වූ අධ්‍යාපන ක්‍රමය හරහා වැවිලි භෝග තාක්ෂණය සහ වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ප්‍රතීතන ඩිප්ලෝමා පාඨමාලා දෙකක් ආරම්භ කර ඇත.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සාමූහික දැක්ම වන්නේ ඉහළ නවීන අධ්‍යාපනික ක්‍රමවේදයන් භාවිත කිරීම හරහා දැනුම දියුණු කිරීම සහ තාක්ෂණික ව දක්ෂ සහ සමාජ සවිඥානික වෘත්තිකයන් බිහි කිරීම සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ නවෝත්පාදන මත පදනම් වූ ව්‍යවසායකත්වය උත්ප්‍රේරණය කිරීම සහ එමගින් ක්ෂේත්‍රයේ උපාය මාර්ගික අරමුණු සහ රටේ අවශ්‍යතා ඉටු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම මගින් රටේ ප්‍රමුඛ පෙළේ අධ්‍යයන / වෘත්තීය ආයතනයක් වීමයි.

NVQ පාදක අධ්‍යාපන ක්‍රමයේ ධාරිතා වර්ධනය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන්, නවීන තාක්ෂණයෙන් යුතු තේ රස පරීක්ෂා කිරීමේ රසායනාගාරයක් සහිත නූතන යන්ත්‍රෝපකරණවලින් සමන්විත ආදර්ශ තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාමට ද ආයතනය කටයුතු කර ඇත. එබැවින්, බාහිර අධ්‍යයන පිරිවැය කපා හරිමින්, තේ රස පරීක්ෂාව තේ ශ්‍රේණිගත කිරීම, තේ නිෂ්පාදන වැඩසටහන් වැනි සියලුම වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් අප ආයතනය සවි බල ගැන්වී ඇත.

වෘත්තීය සාමාජිකත්වය ආයතනයේ තවත් ශක්තිමත් අංශයක් වන අතර එය වැවිලි ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන්ගේ වෘත්තීයමය භාවය හඳුනා ගනිමින් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා අති මහත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙසට නව සාමාජිකත්ව කාණ්ඩයන් හඳුන්වා

දීමේ දී, අදාළ පනත සංශෝධනයට ද ආයතනය කටයුතු කරමින් සිටී. ඒ අනුව, 2021 අධ්‍යයන වර්ෂය තුළ දී ගරු සාමාජිකත්ව 9ක්, සම සාමාජිකත්ව 11ක් සහ ආශ්‍රිත සාමාජිකත්ව 5ක් අප විසින් ප්‍රදානය කළෙමු.

අප ආයතනය, ස්වාධීන උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. උපාධි පාඨමාලා තුන පිළිබඳ වැඩසටහන් සහ ආයතනික සමාලෝචනය සකස් කිරීම මේ වන විට අවසන් කර ඇති අතර එය ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර අනුමතිය ලද විගස ම එකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව පවසනුයේ ඉමහත් සතුටිනි. එමෙන් ම, රත්මලාන වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයේ සහය ඇතිව නිපුණතා පදනම මත උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා ද පියවර ගෙන ඇත. අතුරුගිරිය ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි ඉදි කිරීමට යෝජිත පරිපාලන සහ අධ්‍යයන ගොඩනැගිලි සංකීර්ණයෙහි කටයුතු කඩිනමින් නිම කිරීමටත්, අපගේ ආයතනය, උපාධි ප්‍රදානය කිරීමට බලයලත් ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමටත් අපේක්ෂා කරන බව ද ආඩම්බරයෙන් සිහි කිරීමට කැමැත්තෙමු.

කාර්යසාධනයේ ප්‍රගතිය

ප්‍රාදේශීය වැවිලි සමාගම්, කුඩා වතු හිමියන්, පර්යේෂණ ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සහ රට පුරා විසිරී සිටින වෙනත් පාර්ශ්වකරුවන් සමඟ සමීප ව කටයුතු කිරීමට අප හට බලය ලබා දී ඇත. එමෙන් ම, අනාගත නියමුවන් වන වැවිලි ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන්ගේ ධාරිතාව වැඩි කරමින් ව්‍යවසායකයින් සවි බල ගැන්වීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව හරහා ද අපගේ වැඩසටහන් දියත් කිරීමට සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය සහතික කිරීමේ වැඩසටහන ද ඇතුළත් ව ආදායම් උත්පාදන වැඩසටහන් 56ක් පවත්වා සිසුන් 3,428 දෙනෙකුට පුහුණු දායකත්වය (අනුග්‍රාකත්වය) ලබා දී ඇති අතර 2021 අධ්‍යයන වර්ෂය සඳහා කුඩා වතු හිමියන් 3,751ක් සඳහා ද පුහුණු දායකත්වය ලබා දී ඇත.

2021 වර්ෂයේ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ක්‍රියාකාරකම්වල විශේෂත්වය වූයේ, කෝවිඩ් - 19 වසංගත තත්ත්වයට අනුගත වීමක් වශයෙන් සංවිධානය කරන ලද මාර්ග ගත සම්මන්ත්‍රණ සංඛ්‍යාව අසාමාන්‍ය ලෙස ඉහළ යාම හේතුවෙන් වසංගත තත්ත්වය හමුවේ වුව ද වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 476ක් වශයෙන් අසාමාන්‍ය ලෙස ඉහළ යාමක් පෙන්නුම් කිරීමයි. ආයතනය පුහුණු වැඩසටහන්වලින් රු. මිලියන 26.32ක් උපයා තිබුණ අතර අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන් ලියාපදිංචි වීමේ ප්‍රගතිය ඇස්තමේන්තු ගත සිසුන් සංඛ්‍යාවෙන් සියයට 77ක් ලෙස වාර්තා වී තිබුණි. මෙම ක්ෂේත්‍රයට අදාළ ව වැඩමුළු සහ මාර්ග ගත සම්මන්ත්‍රණ 13ක් පවත්වා රු. මිලියන 0.44 ක ආදායමක් ඉපයීමට ආයතනය ඇස්තමේන්තු කර තිබුණ ද 2021 වර්ෂය තුළ දී වැඩමුළු 35ක් පවත්වා රු. මිලියන 3.434 ක ආදායමක් ඉපයීමට හැකි වූ බව අවධාරණය කළ යුතු කරුණකි. 35 දෙනෙකුගේ සහභාගිත්වයකින් යුත් ඇස්තමේන්තුවක් හමුවේ කළමනාකරණ සංවර්ධන වැඩසටහන් 8ක් සඳහා 377 දෙනෙකු සහභාගි වීම ආයතනය විසින් අත්පත් කර ගත් නිදහස් ජයග්‍රහණයකි. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වාර්තා කර ඇති සමස්ත ආදායම රු. මිලියන 28.96ක් වූ අතර එය අධ්‍යයන මූල්‍ය ප්‍රගතියෙන් සියයට 56ක ප්‍රතිශතයකි. රජයේ මුළු ප්‍රදානය රු. මිලියන 93.37ක් වන අතර 2021 මූල්‍ය වර්ෂය අවසානයේ දී ශුද්ධ වත්කම්වල වටිනාකම රු. මිලියන 1,045.53ක් දක්වා වැඩි වී ඇත. එමෙන් ම, 2021 මූල්‍ය වර්ෂය තුළ දී ආයතනයේ ස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම රු. මිලියන 35.15ක් වන අතර අස්පෘශ්‍ය

වත්කම්වල වටිනාකම රු. මිලියන 1.61ක් විය.

ආයතනයේ පුහුණු පහසුකම් බාහිර ආයතන සඳහා කුලියට ලබා දීමේ ආදායම රු. මිලියන 2.28ක් ලෙස වාර්තා කළ අතර පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 120.62ක් වාර්තා විය. එය 2020 වර්ෂයට සාපේක්ෂව සියයට 6ක වැඩි වීමකි. ආයතනය තුළ වැඩ කරන ලද පැය ගණන, 2020 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව වැඩි වීම නිසා මෙම වියදම් සුළු වශයෙන් වැඩි වීමක් පෙන්නුම් කෙරේ. ගෝලීය වසංගත තත්ත්වය සහ වෙනත් බාහිර කරුණු මත සුළු පසුබෑමක් පෙන්වුව ද, ආයතනයේ මූලික ම කාර්යභාරය වනුයේ පුහුණු කටයුතු පවත්වා ගෙන යාමයි.

වසංගත තත්ත්වයේ බලපෑම

කෝවිඩ්-19 වසංගත තත්ත්වය, වෙන් වෙන් වශයෙන් මෙන් ම ප්‍රජාවක් වශයෙන් ද අප වෙත අහිතකර තත්ත්වයක් ඇති කළ නමුදු ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අපි, ආයතනයක් වශයෙන් එකී අභියෝග හමුවේ නො සැලී සිටින්නට තරම් ශක්තිමත් බවට කිසිදු සැකයක් නොමැති බව මගේ හැඟීමයි. මෙම අභියෝගයන් ජය ගනු වස්, අනාගතයේ දී විවිධ අධ්‍යාපනික ආදේශන සැපයීම සඳහා ආයතනයක් වශයෙන් අපගේ හැකියාව වර්ධනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, අධ්‍යන කාර්ය මණ්ඩලය විසින් කාලීන ව සහ අවශ්‍යතාව පරිදි භෞතික ව මෙන් ම මාර්ග ගත ක්‍රමයට ඉගැන්වීමට ද මනා ලෙස සූදානම් වීම ඉතා වැදගත් වේ. එමගින්, අනාගතයේ දී ඇතිවිය හැකි වසංගත තත්ත්වය හමුවේ පමණක් නොව අප නිතරම මුහුණ පාන ස්වාභාවික ආපදා හෝ අහිතකර කාලගුණ <u>තත්ත්වයන්හි දී අධ්‍යාපනය ඇනහිටින අවස්ථාවල දී</u> පවා සිසුන්ගේ අධ්‍යාපනය ආරක්ෂා වනු නිසැකයි. එමගින්, බොහෝ දුරට පුද්ගලිකව ඉගැන්වීම සහ ඉගෙන ගැනීම සඳහා ප්‍රවේශයක් නිර්මාණය කරනු ඇත. ඒ අනුව, භෞතික ව හෝ මාර්ග ගත ක්‍රමයට ඉගැන්වීම කළ හැකි නම්‍යශීලී විෂය මාලාවක් නිර්මාණය කිරීම අවශ්‍ය වනු ඇත. මීට අමතරව, අනාගතයේ දී ද මෙවන් අවස්ථාවන්ට මුහුණ දීම සඳහා පුළුල් පරාසයකින් යුත් තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිත කිරීමට අපගේ කථිකාචාර්යවරුන් මනා දැනුමකින් සන්නද්ධ වීම අවශ්‍ය වන අතර දිවයින පුරාම අපගේ සිසුන් විසිරී සිටින බැවින්, ඇතැම් දේශන මාර්ග ගත ක්‍රමයට පැවැත්වීමට ද ඔවුන් ව <u>සවි බල</u> ගැන්වීම අවශ්‍ය වේ.

නව තාක්ෂණික ක්‍රමවේද භාවිතය

වැවිලි කරුවන් , ගොවීන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරීන් වෙත නවතම තාක්ෂණය, දැනුම සහ අදාළ කුසලතා බෙදා හරිමින් දිවයිනේ සියලුම පර්යේෂණ ආයතන, පෞද්ගලික සහ රාජ්‍ය ආයතන සමගින් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සතු ව ශක්තිමත් සහ ඵලදායී ව්‍යාප්ති සේවා ජාලයක් ඇත. එවැනි ක්‍රියාකාරකම් වැවිලි ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා අතිමහත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම ඒකක මගින් තාක්ෂණයන් තක්සේරු කිරීම සහ ශෝධනය කිරීම, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්ෂේත්‍ර චාරිකා, දැනුවත් කිරීමේ වැඩසටහන්, ආදර්ශන, කණ්ඩායම් සාකච්ඡා සහ ක්ෂේත්‍ර දින සංවිධානය කිරීම වැනි වැදගත් කාර්යයන් ඉටු කරන ලදී. මෙම කාර්යයන්, කාර්මික වර්ධනයන් පිළිබඳ වැවිලි ප්‍රජාව දැනුවත් කිරීමෙහි ලා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙහි තීරණාත්මක සාධක විය. එබැවින්, අප විසින් සිසුන් සහ සහභාගි වන්නන්ගේ වෘත්තීය නිපුණතාව ඉහළ නැංවීම සඳහා සම්මානයට පාත්‍ර වූ ආයතන කිහිපයක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹෙන ලදී.

<u>අධ්‍යයන ජයග්‍රහණ</u>

මෙම වසරට පා තැබීමේ දී, ඔබ අප සැවොම දන්නා පරිදි ඇතැම් විට අපගේ ජීවිත කාලය

තුළ අත්විඳීමට සිදු වූ අතිශයින් ම අභියෝගාත්මක කාල පරිච්ඡේදය ලෙස මෙම ගෝලීය වසංගතය විසින් අප වෙළා ගනු ලැබූ කාලය හැඳින්විය හැකි ය. මෙම අර්බුදය ආරම්භයේ සිට ම අප විසින් අපගේ අධ්‍යයන දින දර්ශකය සංශෝධනය කිරීම, ඇගයුම් පටිපාටි යාවත්කාලීන කිරීම මෙන් ම අපගේ ස්ථිර පාඨමාලා පූර්ණ මාර්ග ගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට කටයුතු කළෙමු. තවද, අප විසින් වසංගත තත්ත්වයට සමගාමී ව, මෙම කාර්යයන් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා විවිධ පාඨමාලා සමඟ සම්බන්ධ වෙමින් ආයතනික වශයෙන් ප්‍රතිචාර දක්වන අධ්‍යයන මණ්ඩලයක් පත් කළෙමු. මෙම සාමූහික ප්‍රයත්නයන් පාඨමාලාවට සම්බන්ධ වී සිටින සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සාර්ථකව සිදු කර ගැනීමෙහි ලා නම්‍යශීලී ප්‍රවේශයකට අනුගත වීම සඳහා මනා පිටිවහලක් විය.

මේ අනුව, ආයතනය මගින් දිවයින පුරා විහිදී ඇති ආයතන සමඟ කටයුතු කිරීම තුළින් අප ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ. මූලිකව ම, සිසුන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා නිපුණතාව වඩාත් ඵලදායී ලෙස ලබා දීමට කටයුතු කිරීමෙන් සහ දෙවනු ව අදාළ ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථා ලබා ගැනීමට සිසු සිසුවියන්ට අවස්ථාව උදා කර දීමත් ය. එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ සිසුන් රැකියා මට්ටම්වල විවිධ කාණ්ඩ යටතේ කර්මාන්තයේ නියුතු වී සිටින්නේ වසංගත තත්ත්වය හමුවේ වුව ද අප ඔවුන්ට ක්ෂේත්‍රය පිළිබඳ නිසි පුහුණුව ලබා දෙන බැවිනි.

උපාය මාර්ගික සංවර්ධන ඉලක්ක

වසර 2022 වන විට වැවිලි කර්මාන්තයට සම්බන්ධ මානව සම්පත්වල කුසලතා සහ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් එම කර්මාන්තය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සංවර්ධනය කිරීමේ උපාධි වැඩසටහන් 3ක් දියත් කිරීමට ජාතික වැවිලි කළමනාකරණ ආයතනය උත්සහ කළේ ය. ස්වාධීන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස අපගේ මීළඟ මධ්‍ය කාලීන සැලැස්ම තුළ ප්‍රමුඛත්වය ලබා දීමට ආයතනය විසින් කටයුතු කර ඇත.

2020-2024 උපාය මාර්ගික ඉලක්ක මගින් ඉදිරි සිව් වසර තුළ සංවිධානයක් ලෙස අප අත් කර ගත යුතු සාර්ථකත්වය පිළිබඳ දළ විශ්ලේෂණයක් පහත දක්වා ඇත.

ඒවා:

- කර්මාන්තය සහ සේවකයා අතර ඇති අධ්‍යයන/ වෘත්තීය හිදැස පිරවීම සඳහා කාලීන වටිනාකමක් සහිත පාඨමාලා හඳුන්වා දීම
- අංශයට ගුණාත්මක සේවාවන් සැපයීම සඳහා ආයතනයේ අධ්‍යයන පීඨය ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය කිරීම
- අලෙවිකරණය සහ ප්‍රවර්ධනය ශක්තිමත් කිරීම සඳහා අපගේ ප්‍රධාන ප්‍රවීණතා ක්ෂේත්‍රවල ඉහළ බලපෑමක් ඇති කරන අධ්‍යාපන විසඳුම් මගින් කැපී පෙනෙන ලෙස කීර්ති නාමය පුළුල් කිරීම
- තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) සහ ISO ප්‍රමිති සහිත යටිතල පහසුකම් සහ සශ්‍රීක පරිසරයක් සංවර්ධනය කිරීම

පැහැදිලිව ම, ආයතනය තුළ පීඨයට, කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට මෙන් ම එහි සුබ පතන්නන්ට සහ පාර්ශ්ව කරුවන්ට සැබැවින් ම ආඩම්බර විය හැකි බොහෝ දේ සිදු වෙමින් පවතී. එහෙත්, ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ප්‍රගතිය සහ ඒවායින් ගත හැකි ප්‍රයෝජනයේ ප්‍රමාණවත් භාවය පිළිබඳව සෑහීමකට පත් විය නො හැක. කෙසේ වුව ද, අප දැනටමත් සිදු කරමින් සිටින කාර්යය දිගටම කර ගෙන යන අතරම, අලුතින් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම අවශ්‍ය වේ.

1. දේශීය හා විදේශීය සිසුන් ආකර්ෂණය කර ගත හැකි සහ ඉදිරි දශක කීපය තුළ

විශිෂ්ට ශාස්ත්‍රීය කටයුතු සඳහා ඉවහල් වන පරිදි අංග සම්පූර්ණ නවීන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

2. තම අත්දැකීම් සමුදාය තුළින් ආයතනයට කීර්තියක් ගෙන දෙන විශිෂ්ටතම සහ ප්‍රායෝගික විද්වතුන් බඳවා ගැනීම

3. වැවිලි කර්මාන්තය පිළිබඳ උනන්දුවක් දක්වන නමුත් ඒ සඳහා මූල්‍ය ශක්‍යතාවක් නොමැති සිසුන්ට ශිෂ්‍යත්ව කිහිපයක් ප්‍රදානය කිරීම තුළින් විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වීම පරිත්‍යාගශීලී අරමුදල් රැස් කිරීමේ අපගේ ප්‍රයත්නයන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය යුතු ය.

4. ශාස්ත්‍රීය ලෝකයේ මෙන් ම කර්මාන්ත සමඟ උපාය මාර්ගික හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම. එක් අතකින්, අපි ලෝකයේ ඉහළින් ම සිටින විශ්වවිද්‍යාල සමඟ හවුල්කරුවකු වීමට කැමැත්තෙමු. අනෙක් අතින්, අපි ශ්‍රී ලංකාවේ හොඳම උපාධි අපේක්ෂක විද්‍යාල සම්බන්ධ කර ගැනීමට කැමැත්තෙමු.

අවසාන වශයෙන් ආයතනයට ප්‍රගතියක් අත් කර ගැනීමට හැකි වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම ගරු වැවිලි අමාත්‍ය තුමාගෙන් ලද අනුග්‍රහය සහ මග පෙන්වීම හේතුවෙනි. ගරු වැවිලි අමාත්‍ය තුමාට සහ ගරු වැවිලි අමාත්‍යාංශ ලේකම් තුමාට සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ සහ රබර් වතු ආශ්‍රිත බෝග වගාව, කර්මාන්තශාලා නවීකරණය සහ තේ සහ රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාට සහ එම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමාට ද **2021** වසර සාර්ථක කර ගැනීම සඳහා ආයතනයේ සභාපති තුමාට සහ **NIPM** පවුලේ සාමාජිකයින් ලබා දුන් විශාල සහයෝගයට ද විශේෂයෙන් ස්තුතිය පුද කර සිටිමි.



ආචාර්ය ප්‍රසාද් ධර්මසේන
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
05.05.2022

ආයතනය පිහිටු වීම සහ එහි අරමුණු සහ බලතල

හැඳින්වීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, 1979 අංක 45 දරන පනත මගින් 1979 ජූලි මස ස්ථාපිත කරන ලද අතර එය වඩාත් ඵලදායී සහ ශක්තිමත් රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කිරීම උදෙසා 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී. මෙම ආයතනය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ලිපිනයෙහි ස්ථාපිත ව පවත්වා ගෙන යනු ලැබේ.

මෙම පනතට අනුව, වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් පවත්වන පුහුණු වැඩසටහන්/ අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීමට සහ ප්‍රධාන කාණ්ඩ 3ක් යටතේ සුදුසුකම් සහිත වැවිලි විධායක නිලධාරීන් සඳහා වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීමට බලතල සහිත ව ස්ථාපිත කර ඇති රජයේ එකම ආයතනය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වේ. කුඩා වතු හිමියන් ද ඇතුළුව වැවිලි කර්මාන්තයේ රැකියා නියුක්තිකයන්ගේ වෘත්තිය හැකියාව ඉහළ නිපුණතාවකින් යුක්ත ව පවත්වා ගෙන යාම එමගින් සහතික කෙරේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් විවිධ පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ විභාග පවත්වන අතර රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධාන සඳහා පර්යේෂණ සහ උපදේශන සේවා සැපයීම ද සිදු කරනු ලබයි.

අරමුණු

මෙම පනත සහ ඊට අදාළ සංශෝධිත පනත් ප්‍රකාර ව, ආයතනයෙහි පොදු අරමුණු පහත පරිදි වේ.

i. වැවිලි සේවයෙහි නියුක්ත සියලු කාණ්ඩයන්ට අයත් සේවා නියුක්තිකයන්ට ආයතනය විසින් ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි හෝ ඇති වෙනත් ආයතන සම්බන්ධ වැවිලි කළමනාකරණයට අදාළ පුහුණු වීමේ පහසුකම් සහ පුහුණු වීමේ පාඨමාලා සැපයීම.

ii. සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තිකයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්ත්වානුකූලකරණ පාඨමාලා සංවිධානය කිරීම.

iii. රාජ්‍ය අංශයෙහි මෙන් ම සහ පෞද්ගලික අංශයෙහි වැවිලි සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම.

iv. තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය හා එබඳු වෙනත් ආයතනයන් සමග සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

v. වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වූ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු පැවැත්වීම සහ සඟරා සහ කලාප පළ කිරීම.

vi. වෙනත් සමාන ආයතනවලින් දැනටමත් විධිවිධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

vii. වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දක්ෂතාව ඇති තැනැත්තන්ට වැවිලි කර්මාන්තයේ මිනිස් බල අවශ්‍යතාවන් ගැන සැලකිලිමත් ව වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම.

viii. වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් වෙනත් ආයතනයකට කළමනාකාරිත්ව, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් හා සේවා සැපයීම.

<u>ආයතනය සතු බලතල</u>

i. යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් ආකාරයකින් අත් කර ගැනීම සහ තබා ගැනීම, බද්දක් හෝ කුලියක් මත ගැනීම හෝ දීම හෝ උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

ii. වැවිලි පර්යේෂණවලට අදාළ ක්ෂේත්‍ර අභ්‍යාස මධ්‍යස්ථාන සහ නියමිත ව්‍යාපෘති අත් කර ගැනීම, පිහිටුවීම, ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

iii. ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ කාර්යක්ෂම පැවැත්ම සඳහා උපකරණ, අරමුදල්, පිරිස් සහ යම් වෙනත් ආධාර බාර ගැනීම

iv. වැවිලි සංවර්ධනයේ සියලු අංග පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, එවැනි පර්යේෂණ පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම, දිරි ගැන්වීම සහ ඒවාට ආධාර කිරීම.

v. ආයතනය විසින් කරනු ලැබූ යම් සේවා ගාස්තු හෝ අය කිරීම් නියම කිරීම.

vi. ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම.

vii. ආයතනයේ සේවා නියුක්තයන් සඳහා අර්ථසාධක අරමුදල් පිහිටුවා පවත්වා ගෙන යාම සහ සුබසාධන සහ විනෝදාස්වාදය සඳහා පහසුකම් සැලසීම.

viii. ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සැදීම.

ix. ආයතනයේ ව්‍යාපාරයේ කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කටයුතු ආයතනයේ යම් සාමාජිකයෙකුට, අධ්‍යක්ෂවරයාට හෝ යම් සේවා නියුක්තයකුට පැවරීම.

x. විවිධ සාමාජිකත්ව ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් තක්සේරු කිරීම සහ ආයතනයේ සියලු සාමාජිකත්ව ශ්‍රේණි සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා විධිවිධාන සැලසීම සහ ඒ විභාගය සඳහා අධ්‍යයන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම, සැපයීම හෝ අනුමත කිරීම.

xi. ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතු සහ සාමාන්‍ය පැවැත්ම උසස් තත්ත්වයක පවතින බවට වග බලා ගැනීම හා එම තත්ත්වය ආරක්ෂා කිරීම

xii. වැවිලි කර්මාන්ත කළමනාකරණයෙහි ආයෝජන ප්‍රවර්ධනය කිරීම

xiii. වැවිලි ක්ෂේත්‍රයට සහ වැවිලි කළමනාකරණයට අදාළ දත්ත එකතු කිරීම සහ බෙදා හැරීම භාර ගැනීමට සහ වැවිලි කර්මාන්තවල සංවර්ධන ශක්‍යතාව අවබෝධ කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම

xiv. වැවිලි කර්මාන්ත කළමනාකරණයට උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ වෙනත් අදාළ නියෝජ්‍යායතන සමග සම්බන්ධීකරණය වීම

පාලක මණ්ඩල වාර්තාව

2021 වර්ෂය තුළ දී පාලක මණ්ඩල රැස්වීම් **09**ක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණය පරිශ්‍රයෙහි දී පවත්වන ලද අතර,

- ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් ඉහළ ම අනුකූලතාවකින් යුතු ව ඉටු කළ බවට සහතික කිරීම
- පුහුණු අංශයේ සියලුම මෙහෙයුම් හා ක්‍රියාකාරකම්වල විනිවිදභාවය හෙළිදරව් වන ආකාරයට කටයුතු කළ බව සහතික කිරීම
- ආයතනයේ සියලුම පාර්ශ්ව කරුවන් වෙත අපේක්ෂිත ප්‍රතිඵල ලබා දීම සඳහා ආයතනය සතු සම්පත් ඉහළ ඵලදායීතාවකින් හා කාර්යක්ෂමතාවකින් යුතු ව මෙහෙයවීම
- ආයතනයේ මධ්‍ය හා දිගු කාලීන උපාය මාර්ග, වාර්ෂික අය වැය සහ ක්‍රියාකාරී සැලසුම, සැලකිය යුතු මූල්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම හා අනුමතිය ලබා දීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

1979 අංක **45** දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ **06** වන වගන්තිය සහ **1981** අංක **76, 1987** අංක **05** සහ **2003** අංක **38** දරන සංශෝධිත පනත්වල විධිවිධාන ප්‍රකාර ව, **2021** වර්ෂයේ පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

පාලක මණ්ඩලයේ සංයුතිය

පාලක මණ්ඩල සාමාජිකයාගේ නම	තත්ත්වය	පාලක මණ්ඩල සාමාජිකයාගේ නම	තත්ත්වය
ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මහතා සභාපති/ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	සභාපති	මහින්ද විදානපතිරණ මහතා සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	සාමාජික
ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	සාමාජික	ආචාර්ය කාංචන සිල්වා මහතා අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි තුරු සවිය අරමුදල	සාමාජික
අරුණි එස්. රණසිංහ මිය අතිරේක ලේකම්/වැවිලි අමාත්‍යාංශය	සාමාජික	එස්. කේ. එල්. ඔබේසේකර මහතා ලේකම් ජනරාල් ශ්‍රී ලංකා වැවිලි කරුවන්ගේ සංගමය	සාමාජික
ආචාර්ය එල්. එස්. කේ. හෙට්ටිආරච්චි මහතා අධ්‍යක්ෂ/තේ පර්යේෂණ ආයතනය	සාමාජික	පී. ඒ. එම්. දැරනියගල මහතා නියෝජිත ශ්‍රී ලංකා පොල් වගාකරුවන්ගේ සංගමය	සාමාජික
ආචාර්ය සී. එස්. රණසිංහ මිය අධ්‍යක්ෂ/පොල් පර්යේෂණ ආයතනය	සාමාජික	චන්දිම වික්‍රමසිංහ මහතා සභාපති/ ශ්‍රී ලංකා තේ කර්මාන්තකරුවන්ගේ සංගමය	සාමාජික
එස්. එන්. මීතලාව මිය අධ්‍යක්ෂ/කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	සාමාජික		

වගුව අංක **01**

- අරුණි එස්. රණසිංහ මිය (අතිරේක ලේකම්/වැවිලි අමාත්‍යාංශය) 2021 මාර්තු මස සිට මණ්ඩලයෙන් ඉවත් විය.

- කේ.ඒ.එච්. ලක්දරණී මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ- සැලසුම්/ රාජ්‍ය වැවිලි අමාත්‍යාංශය) 2021 මාර්තු මස සිට පත් කරන ලදී.

- පී.ඒ.එම්.දැරනියගල මහතා- මිය යාම හේතුවෙන් සාමාජිකත්වයෙන් ඉවත් කරන ලදී.

- මහාචාර්ය දීපාල් මැතිව් (නියෝජිත/ ශ්‍රී ලංකා පොල් වගාකරුවන්ගේ සංගමය) 2021 මාර්තු මස සිට පත් කරන ලදී.

- මහින්ද විදානපතිරණ මහතා (සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) 2021 ජූලි මස සිට සාමාජිකත්වය අවසන් වීම හේතුවෙන් මණ්ඩලයෙන් ඉවත් විය.

- ආචාර්ය එම්. එස්. ටී. ප්‍රියදර්ශන මහතා (සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) 2021 සැප්තැම්බර් මස සිට පත් කරන ලදී.

- චන්දිම වික්‍රමසිංහ මහතා (සභාපති/ ශ්‍රී ලංකා තේ කර්මාන්තකරුවන්ගේ සංගමය) 2021 අප්‍රේල් මස සිට පත් කරන ලද අතර 2021 දෙසැම්බර් මස සිට සාමාජිකත්වය අවසන් වීම හේතුවෙන් මණ්ඩලයෙන් ඉවත් විය.

- අනුර අතුකෝරල (නියෝජිත/ තේ කර්මාන්තකරුවන්ගේ සංගමය) 2021 දෙසැම්බර් මස සිට පත් කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ යන්ට අනුකූලව පිහිටුවා ඇති අතර පහත සඳහන් කරුණු අධීක්ෂණය සඳහා පාලක මණ්ඩලය විසින් නිසි බලතල පවරා ඇත.

- ආයතනයේ මූල්‍ය වාර්තාකරණය.
- ආයතනයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ ව සහතික වීම.
- විගණන විමසුම් හා විගණන වාර්තාවලට අදාළ කරුණු සහ ආයතනය විසින් සකස් කරන ලද පිළිතුරු නිර්දේශ කිරීම .
- ප්‍රසම්පාදන කමිටුවේ තීරණ සමාලෝචනය කිරීම සහ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් උපයෝජනය කිරීම
- අයවැය ඇස්තමේන්තුව සහ තත්‍ය කාර්යසාධනයේ ප්‍රගතිය.
- අතිකාල, ඉන්ධන, දුරකථන සහ විදුලිය සඳහා වැය වන වියදම අයවැය ඇස්තමේන්තුව සමඟ සැසඳීම
- පුහුණු වැඩසටහන් පැවැත් වීම සහ ඒවායේ ක්‍රියාකාරකම් සඳහා දරන ලද වියදම
- ආයතනයට අදාළ අනෙකුත් මූල්‍ය කටයුතු

2021 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් මාර්තු 26 වන දින, අගෝස්තු 10 වන දින, සැප්තැම්බර් 29 හා දෙසැම්බර් 30 වන දින පවත්වා ඇත.

විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය

සාමාජිකයාගේ නම	තත්ත්වය	සාමාජිකයාගේ නම	තත්ත්වය
එස්. එන්. මීතලාව මිය අධ්‍යක්ෂ/කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	සභාපති	මහින්ද විදානපතිරණ මහතා සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	විකල්ප සාමාජික
අරුණි එස්. රණසිංහ මිය අතිරේක ලේකම්/වැවිලි අමාත්‍යාංශය	සාමාජික	ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා අධ්‍යක්ෂ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	මාණ්ඩලික සාමාජික
ආචාර්ය කාංචන සිල්වා මහතා අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි තුරු සවිය අරමුදල	සාමාජික	එල්. ඩී. ජේ. ප්‍රියන්ත මහතා ගණකාධිකාරී ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	මාණ්ඩලික සාමාජික
ආර්. එම්. එම්. එස්. පෙරේරා මිය සහකාර විගණකාධිපති ජාතික විගණන කාර්යාලය	නිරීක්ෂක සාමාජික	කේ. එච්. යු. පී. විජේවීර මහතා අභ්‍යන්තර විගණක ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	ලේකම් විගණන හා කළමනාකරණ කමිටුව

වගුව අංක 02

- අරුණි එස්. රණසිංහ මිය (අතිරේක ලේකම්/වැවිලි අමාත්‍යාංශය) 2021 මාර්තු මස සිට මණ්ඩලයෙන් ඉවත් විය.
- කේ. ඒ. එච්. ලක්දරණී මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ- සැලසුම්/ රාජ්‍ය වැවිලි අමාත්‍යාංශය) 2021 මාර්තු මස සිට පත් කර ඇත.
- මහින්ද විදානපතිරණ මහතා (සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) 2021 ජූලි මස සිට සාමාජිකත්වය අවසන් වීම හේතුවෙන් මණ්ඩලයෙන් ඉවත් විය.
- එම්. එස්. ටී. ප්‍රියදර්ශන (සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) 2021 සැප්තැම්බර් මස සිට පත් කර ඇත.

මුදල් අමාත්‍යාංශයේ නියෝජිත, එස්. එන්. මීතලාව මිය විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය හොබවන ලදී. 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව ඉහත සඳහන් විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

ආයතනයේ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා (CEO) වේ. ඔහුගේ පාලනය යටතේ 2021 මුදල් වර්ෂය අවසන් වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 55 දෙනෙකුගෙන් සමන්විත වූ අතර මෙම ආයතනය, අධ්‍යයන, මුදල්, පරිපාලන, විභාග සහ විගණන යන ප්‍රධාන අංශ 05ක් යටතේ ක්‍රියාත්මක වේ.

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා

අසෝක සිරිවර්ධන මහතා
සභාපති

ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි

අධ්‍යයන අංශය

පුහුණු අංශයේ නිලධාරීන්ගේ නම් සහ තනතුරු පහත දැක්වේ.

එස්. එන්. ඉලංගන්තිලක මිය
පුහුණු කිරීමේ විශේෂඥ
(කෘෂි ආර්ථික)
පුහුණු අංශ ප්‍රධානී

පී. එච්. ජයතිලක මහතා
පුහුණු කිරීමේ විශේෂඥ
(ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)

ආර්. එන්. ලොකුහෙට්ටි මිය
පුහුණු කිරීමේ විශේෂඥ
(කළමනාකරණ)

එච්. එම් වී .එස්. බණ්ඩාර මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)

වී. ඩබ්. ජී. එන්. සී. වීරකෝන් මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(කළමනාකරණ)

එන්.එස්. හෙට්ටිආරච්චි මහතා
පුස්තකාලයාධිපති

පරිපාලන අංශය

පරිපාලන අංශයේ නිලධාරීන්ගේ නම් සහ තනතුරු පහත දැක්වේ.

ජානක එදිරිමාන්න මහතා
සහකාර අධ්‍යක්ෂ (පාලන)

එම්.බී.එම් ඒ.එල්.බණ්ඩාරනායක මහතා
නේවාසිකාගාර කළමනාකරු අතුරුගිරිය

එම්.එල්.ආර්.ජයන්ත මහතා
පරිපාලන නිලධාරි

මංජුල බණ්ඩාර මහතා
නේවාසිකාගාර කළමනාකරු
බොගවන්තලාව

යසෝධා විජේසේකර මෙනෙවිය
ප්‍රසම්පාදන සහකාර

ගිණුම් අංශය

ගිණුම් අංශයේ නිලධාරීන්ගේ නම් සහ තනතුරු පහත දැක්වේ.

එල්. ඩී. ජේ. ප්‍රියන්ත මහතා
ගණකාධිකාරී

එන්. එල්. සේනාධීර මිය
ගිණුම් සහකාර

විභාග අංශය

විභාග අංශයේ නිලධාරීන්ගේ නම් සහ තනතුරු පහත දැක්වේ.

ඩී. එල්. පී. කුලසේකර මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(කෘෂි ආර්ථික)

ජේ. ඒ. ඩී. ජී. එම්. ඉන්ද්‍රාණි මිය
වැඩසටහන් නිලධාරි
(විභාග සහ සම්බන්ධීකරණය)

අභ්‍යන්තර විගණන අංශය

කේ. එච්. යූ. පී. විජේවීර මහතා
අභ්‍යන්තර විගණක

2021.12.31 දිනට අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය

තනතුර	වැටුප් කේතය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
අධ්‍යක්ෂ	HM 1.2	01	01	-
සහකාර අධ්‍යක්ෂ (පාලන)	MM 1.1	01	01	-
ගණකාධිකාරී	MM 1.1	01	01	-
පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික)	MM 1.1	01	01	-
පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණය)	MM 1.1	01	01	-
පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණය)	MM 1.1	01	01	-
පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණය)	MM 1.1	01	-	01
සහකාර අධ්‍යක්ෂ (අලෙවිකරණ, ව්‍යාපාර ප්‍රවර්ධන හා සැලසුම්)	MM 1.1	01	-	01
පරිපාලන නිලධාරි	JM 1.1	01	01	-
නේවාසිකාගාර කළමනාකරු	JM 1.1	02	02	-
පුහුණු කිරීමේ නිලධාරි (කෘෂි ආර්ථික)	JM 1.1	01	01	-
පුහුණු කිරීමේ නිලධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණය)	JM 1.1	01	01	-
පුහුණු කිරීමේ නිලධාරි (කළමනාකරණය)	JM 1.1	01	01	-
පුහුණු කිරීමේ නිලධාරි (වැවිලි ඉංජිනේරු)	JM 1.1	01	-	01
වැඩසටහන් නිලධාරි (විභාග සහ සම්බන්ධීකරණය)	JM 1.1	01	-	01
අභ්‍යන්තර විගණක	JM 1.1	01	01	-
පුස්තකාලයාධිපති	JM 1.1	01	01	-
ගිණුම් සහකාර	MA 3	01	01	-
ප්‍රසම්පාදන සහකාර	MA 3	01	01	-
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර	MA 2.1	01	01	-
කළමනාකරණ සහකාර	MA 1.1	17	16	01
කළමනාකරණ සහකාර (ස්ථිර- රා. ප. ච. 25/2014 අනුව තනතුරට පෞද්ගලික වන සේ)	MA 1.1	03	03	-
රියදුරු	PL 3	07	05	02
රියදුරු (ස්ථිර- රා. ප. ච. 25/2014 අනුව තනතුරට පෞද්ගලික වන සේ)	PL 3	01	01	-
අරක්කැමි	PL 2	02	-	02
කාර්යාල කාර්ය සහායක	PL 1	05	05	-
මුද්‍රණ සහකාර	PL 1	01	01	-
නේවාසිකාගාර සහායක	PL 1	05	03	02
උද්‍යාන සහායක	PL 1	05	02	03
උද්‍යාන සහායක (තනතුරට පෞද්ගලික වන සේ ස්ථිර කර ඇත)	PL 1	01	01	-
සනීපාරක්ෂක කම්කරු	PL 1	01	-	01
සනීපාරක්ෂක කම්කරු (තනතුරට පෞද්ගලික වන සේ ස්ථිර කර ඇත)	PL 1	01	01	-
එකතුව		**70**	**55**	**15**

පාලන අංශය පිළිබඳ සමාලෝචනය

පාලන අංශය, සහකාර අධ්‍යක්ෂ (පාලන) විසින් මෙහෙයවනු ලබන අතර ආයතනයේ සාමාන්‍ය පාලන කටයුතුවල වගකීම ඔහු විසින් දරනු ලබයි. එමෙන් ම, කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, උසස් කිරීම්, මානව සම්පත් සංවර්ධනය වැනි කාර්ය මණ්ඩලයට අයත් සියලුම කටයුතු පාලන අංශය විසින් මෙහෙයවනු ලබයි. ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සහ අලුත්වැඩියා කිරීම ඇතුළත් ආයතනයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු ද මෙම අංශය විසින් මෙහෙයවනු ලබයි. බාහිර සංවිධාන සඳහා නවාතැන් පහසුකම් අවශ්‍ය වූ විට, ආයතනය විසින් අතුරුගිරිය සහ බගවන්තලාව යන මධ්‍යස්ථානයන්හි එකී අවශ්‍යතාවන් සැපයීම සිදු කරනු ලබයි. තවද, කුලී සේවාවන් සැපයීමේ කාර්යයන්වලින් ආදායම් ඉපයීම වර්ධනය කිරීමේ අරමුණින් ආයතනය විසින් සිය සේවාවන්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමවේදයන් සකසා ඇත. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වූ තනතුරු පිරවීමට 2021 වර්ෂය තුළ දී ආයතනය සමත් විය.

සේවක පුතිලාභ

සේවකයන්ගේ වෘත්තියමය කුසලතා වර්ධනය කිරීමේ අරමුණින්, අවශ්‍යතාව අනුව සහ සේවකයා විසින් ඉල්ලීම් කළ විට ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම පිණිස කළමනාකාරිත්වය විසින් ඔවුන් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරවනු ලබයි. 2020 වසරට පෙර සිට පැවති ආයතනික සුබ සාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2021 වසරෙ දීත් එලෙස ම පවත්වා ගෙන යන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)

පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක 2030 වර්ෂය වනවිට සපුරා ගැනීම වෙනුවෙන් ආයතනය කටයුතු කරනු ලැබේ.

තිරසාර සංවර්ධන අරමුණු	ඉලක්ක අංක	විස්තරය
4	4.3	2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.
4	4.4	2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.
8	8.2	විවිධාංගීකරණය, තාක්ෂණික ඉහළ නැංවීම සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කිරීම තුළින් ඉහල මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම.
8	8.6	2020 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.


සභාපති සහ පාලක මණ්ඩලය
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම (HM 1-2)
විභාග අංශය
පුහුණු අංශය
පාලන අංශය
මූල්‍ය අංශය
අභ්‍යන්තර විගණන
වැවිලි කළමනාකරණ
කෘෂි විද්‍යා
කළමනාකරණ හා මූල්‍ය
මධ්‍යම කළමනාකරණ නිලධාරීන් (MM 1-1)
පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණ)
පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික)
පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ)
සහකාර අධ්‍යක්ෂ (අලෙවි ව්‍යාපාර ප්‍රවර්ධන හා සැළසුම්)
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරි
කනිෂ්ඨ කළමනාකරණ නිලධාරීන් (JM 1-1)
වැඩසටහන් නිළධාරි (විභාග)
පුහුණු කිරීමේ නිළධාරි (වැවිලි ඉංජිනේරු)
පුහුණු කිරීමේ නිළධාරි (කෘෂි ආර්ථික)
පුස්තකාලයාධිපති
පුහුණු කිරීමේ නිළධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
පුහුණු කිරීමේ නිළධාරි (කළමනාකරණ)
පරිපාලන නිළධාරි
නේවාසිකාගාර කළමනාකරු අතුරගිරිය
නේවාසිකාගාර කළමනාකරු බගවන්තලව
අභ්‍යන්තර විගණක
ආශ්‍රිත නිළධාරීන් (MA 3)
මාණ්ඩලික සහකාර (පුහුණු)
ප්‍රසම්පාදන සහකාර
ගිණුම් සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික)(MA 2-1)
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන (MA 1-1)
කළමනාකරණ සහකාර (10)
කළමනාකරණ සහකාර (06)
කළමනාකරණ සහකාර (05)
ප්‍රාථමික මට්ටම (පුහුණු) (PL-3)
රියදුරු -7
ප්‍රාථමික මට්ටම (පුහුණු) (PL-2)
අරක්කැමි-2
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (PL-1)
කාර්යාල කාර්ය සහායක - 5
උද්‍යාන සහායක - 5
කම්කරු - 2
මුද්‍රණ සහායක - 1
සනීපාරක්ෂක කම්කරු - 1
නේවාසිකාගාර සහායක - 5

ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන පුහුණු වැඩසටහන්

වැවිලි ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් / අධ්‍යයන පාඨමාලා සාර්ථක ලෙස නිම කරන්නන්ට සහ සුදුසුකම් ලත් වැවිලි විධායක නිලධාරින්ට වෘත්තියමය සාමාජිකත්වය පිරිනැමීම සඳහා බලයලත් එකම ආයතනය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වේ. තේ, රබර්, පොල්, උක්, කජු, කුරුඳු, කිතුල් සහ තල් වැනි භෝග ආශ්‍රිත කුඩා වතු හිමියන් ඇතුළුව වැවිලි කර්මාන්තයේ නියුක්ත වූවන්ගේ වෘත්තියමය නිපුණතාව ඉහළ ම මට්ටමකින් පවත්වා ගෙන යාම සඳහා මෙම ආයතනය සහතික වේ. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ඉලක්ක කර ගත් ප්‍රධාන කාර්යයන් පහත පරිදි ප්‍රධාන කාණ්ඩ 07ක් යටතේ දක්වනු ලැබේ.

(අ) අධ්‍යයන වැඩසටහන්

පාඨමාලා සඳහා සහභාගි වන්නන්ගේ අධ්‍යාපනික සුදුසුකම් සහ නිපුණතාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අධ්‍යයන පාඨමාලා සකස් කර ඇත. මෙම පාඨමාලා සඳහා සහතික පත් පිරිනැමීම සඳහා, සහභාගී වන්නන් විසින් ප්‍රමාණවත් අධ්‍යන වාර්තාවක් පවත්වා ගෙන යා යුතු අතර ඔවුන් බඳවා ගනු ලබන පාඨමාලාවන්හි අන්තර්ගත කොන්දේසි සපුරා ලිය යුතු වේ.

අධ්‍යයන වැඩසටහන්වල පහත සඳහන් පාඨමාලාවන් ඇතුළත් වේ.

- වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යා උපාධිය (වයඹ විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ ව)
- වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
- වැවිලි භෝග තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 6 වන මට්ටම)
- වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
- වැවිලි භෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5 වන මට්ටම)
- වැවිලි කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව(පුහුණු වැවිලි කරු)
- පොල් වගාව සහ සැකසීම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි ගිණුම්කරණය, මූල්‍ය සහ පිරිවැය කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (CMA හා ඒකාබද්ධ ව)
- පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටම වැඩසටහන්

(ආ) වෘත්තීය වැඩසටහන්

මෙම වෘත්තීය පාඨමාලා පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වනුයේ වැවිලි අධ්‍යාපනයෙහි විවිධ පැතිකඩයන් පිළිබඳ න්‍යායාත්මක/ප්‍රායෝගික දැනුම සහ කුසලතා වර්ධනය කිරීම උදෙසා පුහුණුව ලබා දීම වේ. වැඩසටහන් සඳහා සහභාගි වන්නන්ගේ වෘත්තීය නිපුණතා තක්සේරු කිරීම සහ වැඩි දියුණු කිරීම උදෙසා සහ ආයතනයට ඔවුන්ගේ දායකත්වය වැඩි කිරීමේ අරමුණින් මෙම පාඨමාලා සැලසුම් කර ඇත.

ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තීය වැඩසටහන් පහත පරිදි වේ.

- තේ නිෂ්පාදනය සහ කර්මාන්තශාලා පිළිබඳ වෘත්තීය වැඩසටහන
- රබර් නිෂ්පාදනය සහ කර්මාන්තශාලා පිළිබඳ වෘත්තීය වැඩසටහන
- භාෂා ප්‍රවීනතා විභාගය

(ඇ) නිපුණතා සංවර්ධන වැඩසටහන්

මෙම කාණ්ඩය යටතේ ඇති වැඩසටහන් විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ විශේෂිත රැකියා සඳහා සෘජුවම අදාළ වන කුසලතා හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ය. තවද, වැඩසටහන් සඳහා සහභාගි වන්නන්, රැකියාවට අදාළ නවීන තාක්ෂණයන් සහ වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් සමඟ සමීප කර වීම මේ තුළින් අපේක්ෂා කරනු ලබයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශයට අනුයුක්ත කර ඇති නිලධාරින්ගේ රැකියා පැතිකඩයන්ට අදාළ දැනුම සහ කුසලතා වැඩි දියුණු කරනු වස්, 2020 වර්ෂයේ දී ආයතනය විසින්, මෙම කාණ්ඩය යටතේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් හඳුන්වා දී ඇත.

ආයතනය විසින් පහත සඳහන් නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. වැඩමුළු, සම්මන්ත්‍රණ සහ පරිසංවාද එම වැඩසටහන් අතර වේ.

- තාක්ෂණික සංවර්ධන වැඩසටහන්
- කුසලතා සංවර්ධන වැඩසටහන්
- කම්කරු සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්
- කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන්

(ඈ) වැවිලි කළමනාකරණයට අදාළ ප්‍රකාශන නිකුත් කිරීම (වැවිලි කළමනාකරණය පිළිබඳ සඟරා, පුවත් පත්‍රිකා, පුහුණු වැඩසටහන් පිළිබඳ ශිෂ්‍ය අත්පොත්, පෙළ පොත් සහ අනෙකුත් වාර සඟරා)

(ඉ) වැවිලි කළමනාකරණය පිළිබඳ පර්යේෂණ සහ උපදේශන සේවා සැපයීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයට සේවකයින් බඳවා ගැනීම සහ උසස් කිරීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ සහ විභාග (වාචික සහ ලිඛිත) පැවැත්වීම

(ඊ) සුදුසුකම් ලත් වැවිලි විධායක නිලධාරීන් සඳහා ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම (ගරු සාමාජිකත්වය, සම සාමාජිකත්වය, ආශ්‍රිත සාමාජිකත්වය, සහ ශිෂ්‍ය සාමාජිකත්වය)

(උ) බාහිර සංවිධානවලට ඔවුන්ගේ පුහුණු වැඩසටහන් සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා ආයතනයේ පහසුකම් සැපයීම (ආහාර, නවාතැන් සහ දේශන ශාලා ආදිය)

සමකාලීන අවශ්‍යතාවන්ට අදාළ ව වැඩසටහන් පැවැත්වීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් මෙම ක්ෂේත්‍රය පිළිබඳව සමීක්ෂණ පවත්වා කාලීන අවශ්‍යතා හඳුනා ගනු ලැබේ. කාලීන අවශ්‍යතා පදනම් කර ගෙන, 2021 අධ්‍යයන වර්ෂය තුළ දී ආයතනය විසින් පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

(අ) තේ රස පරීක්ෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකාවේ මෙන් ම වෙනත් තේ වගා කරන සහ ආනයනය කරන රටවල වෘත්තීය තේ රස පරීක්ෂකයින් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින්, තේ රස පරීක්ෂාව පිළිබඳව වඩාත් පුළුල් පරාසයකින් දැනුම සහ කුසලතාව ලබා දීමේ අරමුණින්, තේ නිෂ්පාදනයේ සහ අලෙවියේ නියැලී සිටින්නන්ට මෙන් ම තේ රස පරීක්ෂක ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන පාසල් හැර යන්නන් සඳහා ද විශේෂයෙන් මෙම වැඩසටහන් සැලසුම් කරන ලදී. මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින්නන්ගෙන් මෙන් ම පාසල් හැර යන්නන්ගෙන් ද මෙම වැඩසටහන සඳහා ඉහල ඉල්ලුමක් පැවතුණු අතර මෙම වැඩසටහන තුළින් වෘත්තීය තේ රස පරීක්ෂකයින් බිහි කර මෙම ක්ෂේත්‍රයේ තේ රස පරීක්ෂකයින්ගේ හිඳැස පිරවිය හැකි ය.

(ආ) කාබනික කෘෂිකර්මය සහ වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව

මෑතක දී, සංවර්ධිත ලෝකයේ කාබනික පොහොර භාවිතයෙන් වගා කරන ලද කෘෂිකාර්මික පාරිභෝජ්‍ය භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම ඉහළ යමින් පවතී. කාබනික කෘෂිකර්මය පිළිබඳව වැවිලි සහ කෘෂිකාර්මික අංශයේ නියුක්ත වූවන් මෙන් ම ව්‍යවසායකයින් ද දැනුවත් කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, ඉහත වැඩසටහන සැලසුම් කර ආරම්භ කර ඇත. කාබනික කෘෂිකාර්මික ක්‍රම, නිෂ්පාදන සහ කාබනික නිෂ්පාදනවල ගුණාත්මක භාවය වර්ධනය කිරීමේ අරමුණින්, භාවිත කරන තාක්ෂණය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික විෂය කරුණු සැපයීම මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වේ.

රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැඩසටහන් පැවැත්වීම

සෞභාග්‍යයේ දැක්ම නැමති ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, අහිතකර රසායනික ද්‍රව්‍යවලින් ආසාදනය නො වූ (විෂ රහිත) ආහාර පරිභෝජනය කරමින් නිරෝගී ශක්ති සම්පන්න පුරවැසියන්ගෙන් සැදුම් ලත් ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණින්, දැනට රටේ පවතින කෘෂිකාර්මික රටාව කාබනික කෘෂිකාර්මික රටාවක් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගෙන ඇත.

කාබනික කෘෂිකර්මය යනු පසෙහි, පරිසර පද්ධතියෙහි සහ ජනතාවගේ සෞඛ්‍යය තිරසාර කරන ඵලදායී පද්ධතියකි.

එබැවින්, මෙම රාජ්‍ය ප්‍රතිපත්තිය හා සමගාමීව, 2021 වර්ෂය තුළ දී ආයතනය විසින් පහත සඳහන් සම්මන්ත්‍රණ/ මාර්ග ගත සම්මන්ත්‍රණ පවත්වා ඇත.

- මාර්ග ගත සම්මන්ත්‍රණ: කාබනික ශ්‍රී ලංකාවක් : වැවිලි ක්ෂේත්‍රයේ අභියෝග සහ අවස්ථාවන්
- මාර්ග ගත සම්මන්ත්‍රණ: ආර්ථික ස්ථාවරත්වය සහ සැමට සෞභාග්‍යය සඳහා පුනර්ජනනීය කාබනික වගාව
- මාර්ග ගත සම්මන්ත්‍රණ: කාබනික වගාව සහ වැවිලි කරු
- මාර්ග ගත සම්මන්ත්‍රණ: තිරසාර වැවිලි සංස්කෘතියක් උදෙසා රජයේ නිලධාරින්ගේ කාර්යභාරයන්
- මාර්ග ගත සම්මන්ත්‍රණ: ශ්‍රී ලංකාවේ ආර්ථික ස්වශක්තිතාව ඉහළ නැවීම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ දායකත්වය : අවස්ථාවන් සහ අභියෝග





පුළුල් අත්දැකීම් සහ දැනුම සහිත ජාතික සහ අන්තර්ජාතික වශයෙන් මෙම ක්ෂේත්‍රයේ නියැලෙන ප්‍රවීණ සම්පත් දායකයින්, අධ්‍යාපනඥයින් සහ ව්‍යවසායකයින් විසින් මෙම වැඩසටහන් පවත්වන ලදී.

පුහුණු වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය

ආයතනය විසින් මූලික ව ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එනම්, වැවිලි සංස්ථාපිත අංශය සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් සහ රජයේ අරමුදල් භාවිතයෙන් විශේෂයෙන්ම කුඩා වතුහිමි අංශය සඳහා නොමිලේ පවත්වනු ලබන ධාරිතා සංවර්ධන වැඩසටහන් වශයෙනි.

රටේ අභියෝගාත්මක පාරිසරික තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මාර්ග ගත අධ්‍යාපන ක්‍රමයට අනුගත විය. වැවිලි ක්ෂේත්‍රයට අදාළ ව නව මාර්ග ගත වැඩමුළු හඳුන්වා දීම සහ ඉහත තාක්ෂණය හරහා ක්‍රියාත්මක වැඩසටහන් සම්පූර්ණ කිරීමට හැකි වීම.

ආදායම් උත්පාදන වැඩසටහන්

ආයතනයට ආදායම් උත්පාදනය කිරීම සඳහා ආයතනය විසින් 2021 වර්ෂය තුළ දී පහත සඳහන් අධ්‍යයන සහ වෘත්තීය වැඩසටහන් ආරම්භ කරන ලදී.

2021 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ආදායම් උත්පාදන වැඩසටහන්

අංකය	වැඩසටහන් කාණ්ඩය	කාලසීමාව	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
අධ්‍යයන වැඩසටහන්				
01	වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	මාස 18	1	21
02	වැවිලි භෝග තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 06)	මාස 12	1	21
03	වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05)	මාස 24	1	40
04	වැවිලි භෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05)	මාස 12	1	21
05	වැවිලි කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	මාස 18	1	15
06	තේ රස පරීක්ෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව	මාස 06	1	21
07	කාබනික කෘෂිකර්මය සහ වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව	දින 24	1	24
08	පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	මාස 12	1	26
වෘත්තීය වැඩසටහන්				
09	තේ නිෂ්පාදනය සහ කර්මාන්තශාලා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	දින 09	1	26

10	භාෂා ප්‍රවීණතා විභාගය	දින 04	1	12
තාක්ෂණික සංවර්ධන වැඩසටහන්				
11	තේ රස පරීක්ෂාව සහ ශ්‍රේණි ගත කිරීම	දින 03	1	8
කළමනාකරණ සංවර්ධන වැඩසටහන් (ඉල්ලුමට සරිලන වැඩසටහන්)				
12	තුරු සවිය අරමුදලේ කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප සහ නායකත්ව පුහුණු වැඩසටහන්	දින 01	1	7
13	රාජ්‍ය වැවිලි අමාත්‍යාංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප සහ කාර්යාල පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන්	දින 01	1	61
14	රාජ්‍ය වැවිලි අමාත්‍යාංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා ලිපි ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහන්	දින 01	1	53
15	තාක්ෂණික ඇගයීම් කමිටුවල සහ ප්‍රසම්පාදන කමිටුවල දුර්වලතා සහ ප්‍රමාදයන් වළක්වා ගන්නේ කෙසේ ද පිළිබඳ වැඩසටහන්	දින 01	1	78
16	ආයතන සංග්‍රහය පිළිබඳ කළමනාකරණ සංවර්ධන වැඩමුළුව	දින 01	1	63
17	මූල්‍ය රෙගුලාසි	දින 01	1	50
18	රජයේ නිලධාරීන් සඳහා MS Word	දින 01	1	36
19	රජයේ නිලධාරීන් සඳහා MS Excel	දින 01	1	29
කුසලතා සංවර්ධන වැඩසටහන්				
20	වැවිලි කළමනාකරණයේ දී උසස් Excel තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ කුසලතා සංවර්ධන වැඩසටහන	දින 01	1	120
වසර 13 ක අධ්‍යාපන වැඩසටහන – NVQ 04				
21	තේ කර්මාන්තශාලා සහායක (වසර 13 ක අධ්‍යාපනය)- NVQ 04	මාස 06	1	23
22	තේ ක්ෂේත්‍ර සහායක (වසර 13 ක අධ්‍යාපනය) - NVQ 04	මාස 06	1	53
WEBINAR - මාර්ග ගත සම්මන්ත්‍රණ				
23	වැවිලි ක්ෂේත්‍රයේ දී බලශක්තිය සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා පරිගණක භාවිත බුද්ධිය යොදා ගැනීම පිළිබඳ මාර්ග ගත සම්මන්ත්‍රණ	දින 01	1	58
24	මාර්ග ගත සම්මන්ත්‍රණ : කාබනික ශ්‍රී ලංකාවක් : වැවිලි ක්ෂේත්‍රයේ අභියෝග සහ අවස්ථාවන්	දින 01	1	907
25	මාර්ග ගත සම්මන්ත්‍රණ : ආර්ථික ස්ථාවරත්වය සහ සැමට සෞභාග්‍යය සඳහා පුනර්ජනනීය කාබනික වගාව	දින 01	1	411

26	මාර්ග ගත සම්මන්ත්‍රණ : කාබනික වගාව සහ වැවිලි කරු	දින 01	1	218
27	මාර්ග ගත සම්මන්ත්‍රණ : තිරසාර වැවිලි සංස්කෘතියක් උදෙසා රජයේ නිලධාරින්ගේ කාර්යභාරයන්	දින 01	1	151
28	මාර්ග ගත සම්මන්ත්‍රණ : කෝවිඩ් 19 වසංගත තත්ත්වයට පෙර සූදානම සහ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිචාර	දින 01	1	151
29	මාර්ග ගත සම්මන්ත්‍රණ : ශ්‍රී ලංකාවේ ආර්ථික ස්වශක්තිතාව ඉහළ නැවීම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ දායකත්වය, අවස්ථාවන් සහ අභියෝග	දින 01	1	117
කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්				
30	රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය (මාර්ග ගත)	දින 01	1	19
31	ප්‍රසම්පාදනය- උපදේශකවරුන් තේරීම	දින 01	1	20
32	කාර්යාල පටිපාටි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම	දින 01	1	9
33	කාර්යාල පටිපාටි සඳහා අයැදුම් කිරීම	දින 01	1	12
34	කාර්යාල ගොනු කළමනාකරණය	දින 01	1	15
35	කාර්යාලීය ලිපි සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු උපදෙස්	දින 01	1	15
36	කාර්යාලීය කාර්යයන් සඳහා විද්‍යුත් තැපැල භාවිත කරන විට අනුගමනය කළ යුතු මූලික අවශ්‍යතා සහ සාරධර්ම	දින 01	1	14
37	කාර්යාලීය කාර්යයන් සඳහා ලියාපදිංචි තැපැල භාවිත කරන විට අනුගමනය කළ යුතු මූලික නීති	දින 01	1	14
38	ඵලදායී කාල කළමනාකරණය	දින 01	1	10
39	අර්බුද කළමනාකරණ තාක්ෂණික ක්‍රම	දින 01	1	10
40	රැස්වීම කළමනාකරණ තාක්ෂණික ක්‍රම	දින 01	1	14
41	වෘත්තීය සාර්ථකත්වය සඳහා වැඩි දියුණු කළ යුතු නායකත්ව ගුණාංග	දින 01	1	14
42	විගණන විමසුම්	දින 01	1	20
43	විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව	දින 01	1	7
වැඩමුළු				
44	වැවිලි භෝග විවිධාංගීකරණය මගින් ලාභදායීත්වය උපරිම කිරීම	දින 01	1	15
45	වැවිලි කර්මාන්තය සඳහා පස සංරක්ෂණ ක්‍රම යෙදීම	දින 01	1	12

46	වැවිලි කර්මාන්තයේ දී වාණිජමය කැලෑ සහ දැව කළමනාකරණය (මාර්ග ගත)	දින 01	1	24
47	චක්‍රීය ආර්ථිකය සහ වැවිලි ක්ෂේත්‍රයේ දී එහි භාවිතය	දින 01	1	12
48	නිර්මාණාත්මක වැඩබිම (මාර්ග ගත) කළමනාකරණය කිරීම	දින 01	1	12
49	වැවිලි අංශය සඳහා භූ විද්‍යා තොරතුරු පද්ධතිය යොදා ගැනීම	දින 01	1	24
50	වැවිලි ක්ෂේත්‍රය සඳහා බලශක්ති කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ මාර්ග ගත දැනුවත් කිරීමේ වැඩසටහන	දින 01	1	17
විශේෂ වැඩසටහන්				
51	මහවැලි සංවර්ධන අධිකාරියේ වැඩසටහන්	දින 01	1	32
52	ඉඩම් නීතිය සහ අනවසර අල්ලා ගැනීම් පාලනය කිරීම (මාර්ග ගත)	දින 01	1	30
53	CDA කාර්ය මණ්ඩලය සඳහා දෙමළ භාෂා වැඩසටහන		1	127
54	මතුරට වැවිලි සඳහා මූලික Excel පාඨමාලාව	දින 01	1	34
55	නව තාක්ෂණය හඳුන්වා දීම සහ තේ කෙරෙහි දේශගුණික විපර්යාසයන්හි බලපෑම		1	25
56	කාර්යාලීය කාර්යයන් සඳහා විද්‍යුත් තැපැල භාවිත කරන විට අනුගමනය කළ යුතු මූලික අවශ්‍යතා සහ සාරධර්ම	දින 01	1	50
	එකතුව		**56**	**3428**

වගුව අංක **03**

ඉහත සඳහන් වැඩසටහන්වලට අමතරව, පෙර වර්ෂයේ දී ආරම්භ කරන ලද පහත සඳහන් වැඩසටහන්, පාඨමාලා සහ විභාග මෙම වසරේ දී ද අඛණ්ඩව පවත්වා නිම කරන ලදී.

2020 වසරේ සිට අඛණ්ඩව පවත්වනු ලබන අධ්‍යයන වැඩසටහන්

අංකය	වැඩසටහන	කාලසීමාව	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
01	වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	මාස 18	2	25
02	වැවිලි භෝග තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 06)	මාස 12	1	16
03	වැවිලි භෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05)	මාස 12	1	23
04	වැවිලි ගිණුම්කරණය, මූල්‍ය සහ පිරිවැය කළමනාකරණය පිළිබඳ උසස්	මාස 15	1	10

	සහතික පත්‍ර පාඨමාලාව			
05	පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	මාස 12	1	27
06	වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05)	මාස 18	1	25
එකතුව			**07**	**126**

වගුව අංක **04**

ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය - 2021

ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම තුළින් අපේක්ෂිත ආදායම් උත්පාදන වැඩසටහන් සංඛ්‍යාව 56ක් වන අතර ඉන් වැඩසටහන් 41ක් පවත්වා ඇත. එබැවින් 2021 වසරේ දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රගතිය 137%ක් ලෙස වාර්තා වී ඇත. අපේක්ෂිත පුහුණු ආදායම වූ රු. මිලියන 49,549 ට සාපේක්ෂව 53% ක මූල්‍ය ප්‍රගතියක් ආයතනය විසින් ලබා ගෙන ඇත. ඉලක්ක කළ පුහුණු වන්නන් සංඛ්‍යාව වූ 719 හා සැසඳීමේ දී එය වතු කාර්ය මණ්ඩලයේ පුහුණු වන්නන් 3,428 දක්වා ඉහළ ගොස් තිබුණු අතර එය අපේක්ෂිත සංඛ්‍යාවෙන් 476% ක වැඩි වීමකි. වැඩසටහන් වැඩි සංඛ්‍යාවක් මාර්ග ගත වැඩමුළු ලෙස පැවැත්වීම හේතුවෙන් පුහුණු ආදායම අපේක්ෂිත මට්ටමට ළඟා වී නො තිබුණි. කෘෂිකාර්මික හා වැවිලි ක්ෂේත්‍රයේ කාලීන ප්‍රවණතා සහ ගැටලු වන කාබනික වගාව, දේශගුණික විපර්යාස, කොවිඩ් වසංගතය ආදියට විසඳුම් සෙවීම සඳහා ආයතනය විසින් මාර්ග ගත ක්‍රමයට මාර්ග ගත සම්මන්ත්‍රණ හතක් නොමිලේ පවත්වනු ලැබීය. 2021 වසරේ දී ද 2020 වසරේ මෙන් වැඩසටහන් පැවැත්වීම කෙරෙහි කොවිඩ් 19 වසංගත තත්ත්වය සෘණාත්මකව බලපා තිබුණි.

පුහුණු වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2021

වැඩසටහනේ නම	ඇස්තමේන්තුව			සත්‍ය			ප්‍රගතිය		
	වැඩසටහන් ගණන	සිසුන් ගණන	ආදායම (රු.මිලි)	වැඩසටහන් ගණන	සිසුන් ගණන	ආදායම (රු.මිලි)	වැඩසටහන්	සිසුන්	ආදායම
අධ්‍යයන වැඩසටහන්	15	294	29.43	10	227	12.99	67%	77%	44%
කුසලතා සංවර්ධන වැඩසටහන්	5	75	1.47	1	120	0.21	20%	160%	14%
තාක්ෂණික සංවර්ධන වැඩසටහන්	1	20	0.49	1	8	0.26	100%	40%	53%
විශේෂ පුහුණු වැඩසටහන්/වැඩමුළු	13	165	0.94	35	2620	3.43	262%	1588%	365%
කළමනාකරණ සංවර්ධන වැඩසටහන්	3	35	0.44	8	377	0.30	267%	1077%	68%

13 වසරක සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන	2	100	16.75	2	76	9.12	100%	76%	54%
කම්කරු සංවර්ධන වැඩසටහන්	1	20	0.03	කොවිඩ් - 19 හේතුවෙන් නොපැවැත්වුණි.					
විදේශීය පුහුණු වැඩසටහන	1	10	-	කොවිඩ් - 19 හේතුවෙන් නොපැවැත්වුණි.					
එකතුව	41	719	49.55	56	3428	26.32	137%	476%	53%
බාහිර විභාග	25		2.50	29	-	2.64	116%	-	106%
මුළු අධ්‍යයන ආදායම	66	719	52.05	85	3428	28.96	129%	476%	56%

වගු අංක 05



ප්‍රස්තාර 01



ප්‍රස්තාර 02

ආදායම් උත්පාදන වැඩසටහන්වල ලාභ අලාභ විශ්ලේෂණය

ආදායමක් ඉපයීමේ අරමුණින් ආයතනය විසින් ඉතා සුළු අය කිරීමක් සහිත ව විවිධ අධ්‍යයන, වෘත්තීය හා කුසලතා සංවර්ධන පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. 2021 වසර තුළ දී පුහුණු ක්‍රියාකාරකම්වලින් මුළු පුහුණු ආදායම වන රු. මිලියන 28.96න් 58% ක සාමාන්‍ය ලාභාන්තිකයක් සහිත ව රු. මිලියන 16.93ක ශුද්ධ ආදායමක් වාර්තා කර ඇත. වැඩසටහන්වලින් වැඩි ප්‍රමාණයක් මාර්ග ගත ක්‍රමයට පවත්වනු ලැබූයෙන් ආර්ථික සහ සෞඛ්‍ය අර්බුද මධ්‍යයේ වුව ද වැඩසටහන්වලින් ලත් ලාභය වැඩි වී ඇත.

සෑම කාණ්ඩයක ම වැඩසටහනක් සඳහා ම මෙම ලාභ අලාභ විශ්ලේෂණය පහත අංක 06 වගුවේ දක්වා ඇත.

වැඩසටහනේ නම	ආදායම (රු.මිලි)	පිරිවැය (රු.මිලි)	ලාභය/අලාභය (රු.මිලි)	ලාභ ප්‍රතිශතය
අධ්‍යයන හා වෘත්තීය වැඩසටහන් පසුගිය වසරේ සිසුන් ද ඇතුළත් ව	12.99	6.01	6.98	54%
කළමනාකරණ සංවර්ධනය	0.30	0.21	0.09	30%
තාක්ෂණික සංවර්ධනය	0.26	0.14	0.12	46%
කුසලතා සංවර්ධනය	0.21	0.05	0.16	76%
වැඩමුළු හා විශේෂ වැඩසටහන්	3.43	0.53	2.90	85%
13 වසරක සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන	9.12	4.29	4.83	53%
වැඩසටහන්වල මුළු ආදායම, පිරිවැය සහ ලාභය	26.32	11.23	15.09	57%
බාහිර විභාගවලින් ලද ආදායම	2.64	0.80	1.84	70%
මුළු අධ්‍යයන ආදායම, පිරිවැය සහ ලාභය	28.96	12.03	16.93	58%

වගු අංක 06

කුඩා වතු හිමියන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් - 2021

ආයතනය විසින් වැවිලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමි අංශය ඔස්සේ, වැවිලි කර්මාන්තයට දක්වන දායකත්වය සහ එම අංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත. කුඩා වතු හිමියන්

සඳහා වන ධාරිතා වර්ධන වැඩසටහන් යටතේ භාණ්ඩාගාරය මඟින් ආයතනයේ අයවැයෙන් සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් වෙන් කර ගැනීමට හැකි විය. කුඩා වතු හිමියන්ගේ දැනුම හා ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ආයතනය විසින් 2021 වසර සඳහා රු. මිලියන 7.00 ක මූල්‍ය වෙන් කිරීමක් යටතේ පුහුණු වැඩසටහන් 200ක් සැලසුම් කරන ලදී. එහෙත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එය, රු. මිලියන 4.00ක මූල්‍ය වෙන් කිරීමක් යටතේ වැඩසටහන් 100ක් බවට සංශෝධනය කිරීමට සිදු විය.

කෙසේ වුව ද, ආයතනය විසින් විවිධ සීමාවන්ට මුහුණ දෙමින් කුඩා වතු හිමියන් සඳහා රු. මිලියන 2.66 ක මුදලක් වැය කරමින් වැඩසටහන් 114ක් පවත්වා ඇත. කුඩා වතු හිමියන් සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- මත් ද්‍රව්‍ය නිවාරණ
- ආකල්ප වර්ධන
- කළමනාකරණ සංවර්ධන
- ව්‍යවසායකත්ව සංවර්ධන
- තාක්ෂණික නිපුණතා සංවර්ධන

කුඩා වතු හිමියන් සඳහා පවත්වන ලද ධාරිතා වර්ධන වැඩසටහන්වල විස්තර වගු අංක 05 පරිදි වේ.

කුඩා වතු හිමියන් සඳහා පැවැත්වූ ධාරිතා වර්ධන වැඩසටහන්වල විස්තර

වැඩසටහන් වර්ගය	අපේක්ෂා කළ වැඩසටහන්	අපේක්ෂා කළ සහභාගි වන්නන්	ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි)	වැඩසටහන් ගණන	සහභාගි වූවන් ගණන	පිරිවැය (රු. මිලි)
කුඩා තේ වතු හිමියන්	25	1250	1.25	25	1126	0.51
කුඩා රබර් වතු හිමියන්	25	1250	1.25	27	689	0.54
කුඩා පොල් වතු හිමියන්	30	1500	1.50	50	1433	1.10
වෙනත් භෝග	20	1000	1.0	12	503	0.52
එකතුව	100	2500	4.00	114	3751	2.66
ප්‍රගතිය	-	-	-	114%	75%	71%

වගු අංක 07

වසර 2021 දී ආයතනය වැඩ සටහන් 100ක් සැලසුම් කළ අතර භෞතික ප්‍රගතියෙන් 114%ක් සහ මූල්‍ය ප්‍රගතියෙන් 71%ක් සමඟින් වැඩ සටහන් 114ක් පමණක් පවත්වා ඇත.

පෙර වසරට සාපේක්ෂව පුහුණු වැඩ සටහන් ලබා ඇති ප්‍රගතිය

2020 වසරට සාපේක්ෂව වැඩ සටහන් සංඛ්‍යාව, සහභාගී වන්නන් සංඛ්‍යාව සහ පුහුණු වැඩ සටහන් මඟින් උපයන ලද ආදායමේ යම් වැඩි වීමක් පෙන්නුම් කරයි. මෙම වැඩි වීමට ප්‍රධාන ම හේතුව වූයේ මාර්ග ගත වැඩමුළු යටතේ වැඩ සටහන් පැවැත්වීමයි. ආයතනය මඟින් පවත්වනු ලබන ප්‍රායෝගික වැඩ සටහන්වලට මෙන් ම ක්ෂේත්‍ර පුහුණු වැඩ සටහන්වලට ද මෙය තදින් ම බලපාන ලදී.

වැඩ සටහන් සංඛ්‍යාවේ 229% කද වැඩමුළු සඳහා සහභාගී වන්නන් සංඛ්‍යාවේ 665% ක ද වැඩි වීමක් වාර්තා විය. පුහුණු වැඩ සටහන් ආදායම 22%කින් වැඩි වී ඇත. 2021 වසරේ දී ආයතනයේ ප්‍රධානතම ආදායම් මාර්ගය වූයේ අධ්‍යයන සහ වෘත්තීය වැඩ සටහන් පැවැත්වීමයි. කෙසේ වුව ද, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරේ දී වැඩ සටහන් මඟින් අපේක්ෂා කළ ආදායම උත්පාදනය කර ගැනීමට නො හැකි විය.

කුඩා වතු අංශයේ පුහුණු වැඩ සටහන් සංඛ්‍යාවේ සහ සහභාගී වූවන් සංඛ්‍යාවේ පිළිවෙළින් 714% ක හා 441% ක වැඩි වීමක් දක්නට ලැබේ. පසුගිය වසර හා සැසඳීමේ දී කුඩා වතු හිමියන්ගේ පුහුණු වැඩ සටහන් සඳහා අරමුදල් උපයෝජනය 412%කින් වැඩි වී තිබුණි. 2020 වසරේ ලැබූ දුර්වල ප්‍රතිඵල හේතුවෙන් 2021 වසරේ පුහුණු වැඩසටහන්වලට සාපේක්ෂව ඒවායේ ප්‍රතිඵලවල ශීඝ්‍ර වැඩි වීමක් ඇති විය.

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ප්‍රගතියේ සාරාංශය

	2020	2021	ප්‍රතිශතයේ වැඩිවීම/අඩුවීම
වැඩසටහන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)	17	56	229%
සහභාගී වූ වන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)	449	3428	663%
මුළු පුහුණු ආදායම (රු. මිලි)	23.73	28.95	22%
කුඩා වතු හිමියන් සඳහා වූ වැඩසටහන් ගණන	14	114	714%
පුහුණුව ලැබූ කුඩා වතු හිමියන් ගණන	693	3751	441%
කුඩා වතු හිමියන් පුහුණුව සඳහා දරන ලද පිරිවැය (රු. මිලි)	0.52	2.66	412%

වගු අංක **08**

පාසල් අධ්‍යාපනය නිම වූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ – 4 වන මට්ටම) සහිත නිපුණතා සංවර්ධන වැඩසටහන්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සංවිධානය කරනු ලබන 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ වතු ක්ෂේත්‍රයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා NVQ – 4 වන මට්ටමේ පාඨමාලා සාර්ථකව පවත්වනු ලැබූ අතර මෙම වැඩසටහන යටතේ පහත අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් ඉහළ අධ්‍යාපනය සඳහා සමත්කම් නොදක්වන සිසුන් ඇතුළුව සියලු සිසුන් සඳහා වෘත්තීය ප්‍රවේශය යටතේ සුදුසුකම් ලබාගැනීමට අවස්ථාව සැලසීම.
- සිසුන්ගේ අධ්‍යාපනය සැලකිල්ලට ගෙන ඒ සඳහා යෝග්‍ය අධ්‍යාපන ක්‍රමයක් අ.පො.ස. (සාමාන්‍ය පෙළින්) පසු ලබා දීම.
- ඉගනුම් ක්‍රියාවලියෙන් ඉදිරියට යාමට හෝ වැඩ ලෝකය සමඟ එක් වීම සඳහා උසස් අධ්‍යාපනයේ නියැලීමට පහසුකම් සැලසීම.
- දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ ඉහළ රැකියා ඉල්ලුමක් පවතින ක්ෂේත්‍රයන් සඳහා වෘත්තීය විෂයන් හඳුන්වා දීම.

ජාතික වෘත්තීය කුසලතා රාමුව අනුගමනය කරමින් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින්, වැවිලි ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරා ලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් NVQ – 4 වන මට්ටමේ පාඨමාලා 2ක් පවත්වන ලදී.

සහකාර තේ කර්මාන්තශාලා නිලධාරි - NVQ – 4 වන මට්ටම

- තේ නිෂ්පාදනයේ තාක්ෂණික හා කළමනාකරණ අංශ පිළිබඳව පුහුණු අවස්ථාවන් සැපයීම.
- කර්මාන්තශාලා මට්ටමින් තීරණ ගැනීමට සහ කාර්යසාධනය නිරීක්ෂණය කිරීමට තොරතුරු භාවිතා කරමින්, කාර්යක්ෂමව සහ ඵලදායිතාවකින් යුක්ත ව කාර්යයන් තුළින් දැඩි වෙහෙසකින් තොරව කර්මාන්තශාලා සහ කාර්යාල කටයුතු පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි කිරීම.
- ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරීන් ලෙස වඩාත් සුදුසු අයදුම්කරුවන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම සඳහා වැවිලි සමාගම් සහ පෞද්ගලික තේ කම්හල්වලට අවස්ථාව ලබා දීම.

සහකාර ක්ෂේත්‍ර නිලධාරි - NVQ – 4 වන මට්ටම

- විධිමත් කෘෂිකාර්මික හා ක්ෂේත්‍ර ගත පුහුණුවකින් පසු වතු පරිපාලනය මෙන් ම වෘත්තීය නිපුණතාවලින් හෙබි NVQ – 4 වන මට්ටමේ සුදුසුකම් ලත් ක්ෂේත්‍ර නිලධාරීන් බිහි කිරීම සඳහා කෘෂිකාර්මික දැනුම, තේ වතු ඉඩම් කළමනාකරණය ආදී ක්ෂේත්‍ර සඳහා න්‍යායාත්මක, තාක්ෂණික සහ කළමනාකරණය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීම.

- ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස වඩාත් යෝග්‍ය තරුණ පුහුණු ලාභීන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම සඳහා තේ වතු සමාගම් සහ තේ වතු හිමියන් සඳහා අවස්ථාව සැලසීම.

තේ ක්ෂේත්‍ර නිලධාරි සහ තේ කර්මාන්තශාලා නිලධාරි පාඨමාලා සාර්ථකව නිම කළ සිසුන්හට රැකියා අවස්ථා ලබා ගැනීමට හැකි විය.

වසර තුළ පැවති කොවිඩ් - 19 වසංගතය මධ්‍යයේ වුව ද, අප විසින් විෂය නිර්දේශයට අනුකූලව සියලු සිසුන් සඳහා මාර්ග ගත දේශන පවත්වන ලද අතර අනතුරුව ඔවුන් රැකියා පුහුණුව සඳහා වතුවලට අනුයුක්ත කරන ලදී.

<u>වෙනත් ආයතන සඳහා විභාග පැවැත්වීමේ ප්‍රගතිය</u>

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ එක් අරමුණක් වනුයේ වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් විවිධ විෂයයන් සඳහා උපදේශන සේවා සැපයීමයි. 1987 සිට ආයතනය විසින් වැවිලි අංශයේ විශේෂඥයන් වූ විවිධ රාජ්‍ය /පෞද්ගලික අංශ ආයතනවල සේවකයන් බඳවා ගැනීමට අදාළ වන විභාග පැවැත්වීමේ පහසුකම් සපයනු ලැබේ.

පෙර වසරවල අත්දැකීම්වලට අනුව 2021 වසරේ දී ආයතනය විසින් විභාග 29 ක් පවත්වා රු. මිලියන 2.64 ක ආදායමක් උපයා ඇත. පහත දැක්වෙන වගු අංක 09 න් එම විභාගවල තොරතුරු නිරූපනය කරනු ලබයි.

2021 වසරේ දී පවත්වන ලද විභාග

ආයතනය	විභාග ගණන	අයදුම්කරුවන් ගණන	ඉපයූ ආදායම රු.මිලි
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MM1 – 1 ගණකාධිකාරී තනතුර - තුරු සවිය අරමුදල	1	1	0.07
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය JM1 – 1 ප්‍රවර්ධන නිලධාරි තනතුර - තුරු සවිය අරමුදල	1	1	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MA1 -2 කළමනාකාර සහකාර තනතුර - තුරු සවිය අරමුදල	1	2	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MA1-1 – 1 වන කඩ ඉම - කළමනාකාර සහකාර තනතුරු – ශ්‍රී ලංකා කජු සංස්ථාව	1	20	0.18
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය - MA1–1 - 2 වන කඩ ඉම - කළමනාකාර සහකාර තනතුර - ශ්‍රී ලංකා කජු සංස්ථාව	1	12	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය - MA1–1 - 3 වන කඩ ඉම - කළමනාකාර සහකාර තනතුර - ශ්‍රී ලංකා කජු සංස්ථාව	1	4	
බඳවා ගැනීමේ විභාගය - තාක්ෂණික නිලධාරි තනතුර - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය	1	122	0.34
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය - JM1- II - 2 වන කඩ ඉම - කාර්මික සංවර්ධන අධිකාරිය	1	1	0.10
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය - MA1 - 1 - 3 වන කඩ ඉම - කළමනාකාර සහකාර තනතුර - කාර්මික සංවර්ධන අධිකාරිය	1	4	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය – MA- 3 - 1 වන කඩ ඉම - කළමනාකාර සහකාර තනතුර - කාර්මික සංවර්ධන අධිකාරිය	1	2	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය – MA- 1 - 1 වන කඩ ඉම - කළමනාකාර සහකාර තනතුර - කාර්මි ක සංවර්ධන අධිකාරිය	1	6	
බඳවා ගැනීමේ විභාගය - කළමනාකාර සහකාර තනතුර - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	8	0.03
බඳවා ගැනීමේ විභාගය - පොත් තබන්නා - පොල් සංවර්ධන අධිකාරිය	1	80	0.14
බඳවා ගැනීමේ විභාගය - පරීක්ෂක - පොල් සංවර්ධන අධිකාරිය	1	30	0.10
බඳවා ගැනීමේ විභාගය - අභ්‍යන්තර විගණක - පොල් සංවර්ධන අධිකාරිය	1	45	0.13
බඳවා ගැනීමේ විභාගය - ප්‍රවාහන නිලධාරි - පොල් සංවර්ධන අධිකාරිය	1	10	0.03
බඳවා ගැනීමේ විභාගය -TA-M පොල් සංවර්ධන අධිකාරිය	1	4	0.06
බඳවා ගැනීමේ විභාගය RO - පොල් පර්යේෂණ ආයතනය	1	133	0.12
බඳවා ගැනීමේ විභාගය TO (MA 2-2)- රබර් පර්යේෂණ ආයතනය	1	9	0.07
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MM-1-1 මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය (බප)	1	3	0.23
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය JM-1-1 මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය (බප)	1	2	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MA 1-1(Tech) මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය (බප)	1	2	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MA 1-1(N.Tech)	1	19	

කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය (බප)			
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MA 1-1 -2 වැනි කඩ ඉම - මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය (බප)	1	13	
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය MA 1-1- 3 වැනි කඩ ඉම- මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය (බප)	1	1	
බඳවා ගැනීමේ විභාගය MA 1-1 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	93	0.29
බඳවා ගැනීමේ විභාගය - තේ පර්යේෂක - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	80	0.20
බඳවා ගැනීමේ විභාගය R&D - රබර් පර්යේෂණ ආයතනය	1	33	0.13
බඳවා ගැනීමේ විභාගය - RDO රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව	1	203	0.27
එකතුව	29	943	2.49

වගු අංක 09

<u>වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව</u>

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධ ව වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව පිරිනමනු ලැබේ.

මෙම වැඩසටහන තෙවසරක කාලසීමාවකින් යුක්ත වන අතර එය දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ පවත්වනු ලබයි. බඳවා ගැනීමේ නිර්ණායකයන්ට අනුව උපාධි පාඨමාලාව සඳහා බඳවා ගන්නා සියලු නිලධාරීන් තම විෂය ක්ෂේත්‍රයන්හි වසර 3ක වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතු අතර රැකියාවක නිරත ව සිටිය යුතු ය.

මෙම උපාධි පාඨමාලාව වැවිලි කළමනාකරණ සමාගම්, තේ කුඩා වතු සංවර්ධන අධිකාරිය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, තේ මණ්ඩලය, පොල් වගා කිරීමේ මණ්ඩලය, භෝග පර්යේෂණ ආයතනය (TRI, RRI, CRI, SRI) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, මහවැලි අධිකාරිය, බැංකු සහ රටේ අනෙකුත් ආයතනවල නිලධාරීන් ඉලක්ක කර ඇත.

ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය

1987 අංක 05 දරන සංශෝධන පනතේ සඳහන් නිර්ණායක හා කොන්දේසි මත පදනම්ව ආයතනය විසින් යෝග්‍ය සාමාජිකයන් සඳහා වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම අඛණ්ඩව කර ගෙන යනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ දී ආයතනය විසින් විධායක නිලධාරීන් දස දෙනෙකු සඳහා ගරු සාමාජිකත්ව දහයක් ද (10), විධායක නිලධාරීන් නව දෙනෙකු සඳහා සම සාමාජිකත්ව නවයක් ද (09), විධායක නිලධාරීන් පස් දෙනෙකු සඳහා ආශ්‍රිත සාමාජිකත්ව පහක් ද (05) පිරිනමන ලදී. වසර අවසානය වන විට එක් එක් කාණ්ඩ යටතේ සිටින මුළු වෘත්තීය සාමාජිකයන් ගණන පහත පරිදි වේ.

ගරු සාමාජිකත්ව	31
සම සාමාජිකත්ව	236
ආශ්‍රිත සාමාජිකත්ව	34
ශිෂ්‍ය සාමාජිකත්ව	01
එකතුව	302

වගු අංක 10

වැවිලි ක්ෂේත්‍රයේ අනාගත දැක්ම ප්‍රතිනිර්මාණය කිරීම සහ සාමාජිකයින් අතර තොරතුරු බෙදා ගැනීම අරමුණු කර ගනිමින් 2021 වර්ෂයේ දී ආයතනය විසින් ශ්‍රී ලංකාවේ තිරසාර වැවිලි කළමනාකරණය සඳහා වූ ඒකාබද්ධ ප්‍රවේශයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන වෘත්තීය සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් 2021 පෙබරවාරි මාසයේ දී ක්වීන්ස්බරි හෝටලයේ දී පැවැත් විණි.

ආයතනය සපයන පහසුකම්

- පුස්තකාල පහසුකම්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුස්තකාලයේ තොරතුරු මූලාශ්‍ර 4200 වැඩි ප්‍රමාණයක් ඇති අත ඒවා පොත්, සඟරා සහ වාර සඟරා, පෝස්ටර්, පත්‍රිකා, ලිපි සහ CD, DVD ලෙස වර්ගීකරණය කර ඇත. තවද එම මූලාශ්‍ර වර්ග 2ක් වශයෙන් සංවර්ධනය වෙමින් පවතී; තවද, එම මූලාශ්‍ර, බැහැර දෙන අංශය සහ විමර්ශන අංශය යන අංශ 2කට කාණ්ඩ 2ක් යටතේ වර්ගීකරණය කරමින් පවතී. ඉහත සියලු තොරතුරු මූලාශ්‍ර Duly Decimal Classification – DDC අනුව වර්ගීකරණය කර ඇත.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුස්තකාලය සතුව තේ, රබර්, පොල්, කජු සහ කෘෂිකර්මාන්තය වැනි වැවිලි කර්මාන්තයට අදාළ වටිනා පොත් එකතුවක් දැනටමත් තිබේ. තවද ගිණුම්කරණය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය, පරිගණක විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, සාමාන්‍ය දැනුම සහ විනෝදස්වාදය සම්බන්ධ පොත් එකතුවක් ද ඇත. තවද මෙම පුස්තකාලය විසින් කියවීම, පොත් බැහැර දීම, විමර්ශනය මෙන් ම ව්‍යාප්ති සේවාවන් ද සපයනු ලැබේ. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුස්තකාලය, ස්වයංක්‍රීය පුස්තකාලයක් බවට පත් කිරීමෙන් එය පර්යේෂණ පුස්තකාලයක් බවට පරිවර්තනය කිරීමේ පළමු පියවර තබා ඇත. වසර 2021 වන විට එහි වැඩ නිම කිරීමට අපේක්ෂා කෙරේ.

- ඉගනුම් මධ්‍යස්ථානය

ආයතනය මඟින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රායෝගික සැසි සඳහා සහ වැවිලි කරුවන් වීමට අපේක්ෂිතයින් සඳහා තේ නිෂ්පාදන ක්‍රියාවලියේ සියලුම අංශ පිළිබඳව හඳුන්වා දීමට ආයතනය සතුව ඉගනුම් මධ්‍යස්ථානයක් ඇත. නවීන යන්ත්‍රෝපකරණවලින් සමන්විත මෙම මධ්‍යස්ථානයේ එක් වරකට 20 දෙනෙකු සඳහා පුහුණු පහසුකම් ඇති අතර, තේ රස බැලීමේ පුහුණු ඒකකයක් ද ස්ථාපිත කර ඇත.

නවාතැන් පහසුකම්

ආයතනය සතුව අධ්‍යාපනික හා පුහුණු මධ්‍යස්ථානයකට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් ඇත. දේශීය සහ විදේශීය ඉල්ලුම සපුරාලීමට හැකි වන පරිදි ආයතනය වැඩිදියුණු කිරීමට සහ නවීකරණය කිරීමට ජාතික අයවැය මඟින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. අතුරුගිරිය පුහුණු මධ්‍යස්ථානයේ වායු සමීකරණය කරන ලද දේශන ශාලා 3ක් සහ ශ්‍රවණාගාරයක් ඇත. ශ්‍රවණාගාරයේ වරකට පුද්ගලයින් 200 දෙනෙකුට ඉඩ පහසුකම් සැලසිය හැකි ය. හැට දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමේ හැකියාව ආයතනය සතු වේ.

අතුරුගිරිය නේවාසිකාගාරය

ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - බගවන්තලාව

බගවන්තලාවේ තෙරේසා වතුයායේ ස්ථාපිත ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සතු ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ද පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. එය නවීන පහසුකම් සහිත පුහුණු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු විය යුතු ය. එහි ශ්‍රවණාගාරයේ පුද්ගලයන් 100 දෙනෙකුට දේශන පහසුකම් සැපයිය හැකි අතර 50 දෙනෙකුට දේශන පහසුකම් සැපයිය හැකි මධ්‍යම ප්‍රමාණයේ දේශන ශාලා 2ක් ඇත.

බගවන්තලාව නේවාසිකාගාරයේ වරකට පුද්ගලයින් 70කට ආසන්න ප්‍රමාණයකට නවාතැන් පහසුකම් සැපයිය හැකි ය. මෙහි විශාල භෝජනාගාරයක්, කාර්යාල කාමර 3ක් හා ග්‍රන්ථ 600 කට වඩා ඇති කුඩා පුස්තකාලයක් ඇති අතර නේවාසිකාගාර කළමනාකරු සඳහා බංගලාවක් ද ඇත. නේවාසිකාගාර කළමනාකරු සහ කාර්යාල කාර්ය සහකරුට අමතරව වෙනත් ස්ථිර සේවකයින් කිසිවෙකුත් මෙම මධ්‍යස්ථානයේ සේවයේ යොදවා නොමැත. එබැවින්, පුහුණු සැසි වාර පවත්වන කාලවල දී අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතිය මත අවශ්‍ය සේවකයින් කොන්ත්‍රාත්පදනම මත සේවයේ යොදවනු ලැබේ. මේ වන විට සේවකයින් 3 දෙනෙක් සහ එක් මුරකරුවෙකු තාවකාලික පදනම මත සේවයේ යොදවා ඇත.

ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - දෙනියාය

වරකට 40 දෙනෙකු සඳහා පුහුණු පහසුකම් ඇති මෙම මධ්‍යස්ථානය, දකුණු පළාතේ පුහුණු වැඩ සටහන් පැවැත්වීම/ පහසුකම් සැපයීම සඳහා 2018 වර්ෂයේ දී දෙනියාය ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදී.

කුලී පදනම මත පහසුකම් සැපයීම

නේවාසිකාගාර, දේශන ශාලා, ආහාරපාන වැනි පහසුකම් සැපයීම මඟින් උපයා ගන්නා ලද ආදායම පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත. කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා බොහෝ ආයතන වැඩ සටහන් නො පැවැත්වීම හේතුවෙන් 2021 වර්ෂයේ දී බාහිර ආයතනවලට එම පහසුකම් සැපයීම මඟින් ලැබූ ආදායම විශාල වශයෙන් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය.



ප්‍රස්තාර 03

මූල්‍ය සමාලෝචනය

කාර්යසාධනය

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී අත් කර ගන්නා ලද මූල්‍ය කාර්යසාධනයේ සාරාංශය පහත 11 වගුවේ දැක්වේ.

	2021 (රු.මිලි.)	2020 (රු. මිලි.)	වෙනස (රු. මිලි.)	ප්‍රගතිය (%)
මුළු ආදායම	139.83	210.32	(70.49)	-34%
පුනරාවර්තන ප්‍රදාන	59.37	57.81	1.56	3%
ප්‍රාග්ධන ප්‍රදාන	34.00	25.75	8.25	32%
විශේෂ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන	-	80.81	(80.81)	-
පුහුණු කටයුතුවලින් ලැබූ මුළු ආදායම	30.73	23.74	6.99	29%
වෙනත් ආදායම්	15.74	22.21	(6.47)	-29%
මුළු වියදම	120.63	113.50	7.13	6%
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	45.23	45.13	0.10	0.2%
කුඩා වතු හිමියන්ගේ ධාරිතා වර්ධනය ද ඇතුළුව අධ්‍යයන සහ පුහුණු කටයුතුවලට අදාළ වියදම්	16.32	11.34	4.98	44%
වෙනත් වියදම්	59.08	57.03	2.05	4%
ශුද්ධ අතිරික්තය	19.20	96.81	(77.61)	-80%

වගු අංක 11

ආයතනය විසින් පසුගිය 2020 වසරට සාපේක්ෂව භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රදානයන්හි සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදෙන මුළු භාණ්ඩාගාර ප්‍රදානයන් 2020 වසරේ දී අවසන් වී ඇති බැවින් 2021 වසරේ දී ඉහත

සඳහන් වූ ව්‍යාපෘතියෙන් ආදායම් ඉපයීමක් වාර්තා නො විණි. එය 2021 වසරේ ආදායමේ විශාල පසුබෑමක් පෙන්නුම් කරමින් 34% ක සෘණ ප්‍රගතියක් සඳහා හේතු වී ඇත.

වසරේ පුහුණු ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් උපයා ගත් රු. මිලියන 30.73 ක ආදායම 29% ක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. එය 2020 වසරට සාපේක්ෂව පුහුණු ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් උපයා ගත් ආදායමේ රු. මිලියන 6.99 ක වැඩි වීමක් විය. වෙනත් ආදායම් තුළ රු.මිලියන10.75 ක පොළී ආදායමක් වූ අතර එය පසුගිය වසරේ පැවති අඩු පොළී අනුපාත හේතුවෙන් රු. මිලියන 3.98 දක්වා අඩු වී තිබුණි. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් කුලී පදනම මත පහසුකම් සැපයීමෙන් ලැබූ ආදායම ද අඩු වී තිබුණි. එබැවින් පසුගිය වසරට සාපේක්ෂව වෙනත් ආදායම්වල එකතුව රු. මිලියන 6.47කින් පහත වැටී තිබුණි.

2021 වසර සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව, පසුගිය වසරට සාපේක්ෂව මුළු වියදම රු. මිලියන 7.13කින් වැඩි වී ඇති අතර එය 6%ක් ලෙස වාර්තා වී තිබුණි.

2021 වසරේ දී සේවක වැටුප්, වේතන සහ සුබසාධන වියදම් ඉතා සුළු ප්‍රමාණයකින් වැඩි වී ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව 0.2% ක වැඩි වීමකි. කෙසේ වුව ද, පුහුණු වියදම රු. මිලියන 4.98කින් වැඩි වී ඇති අතර එය පසුගිය වසරේ පුහුණු ආදායමට සමගාමීව 44% ක ප්‍රගතියක් සහ 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ කුඩා වතු හිමියන් සඳහා පැවැත්වූ ධාරිතා වර්ධන වැඩ සටහන්වල වැඩි වීමක් ද පෙන්නුම් කරයි. 2020 වසරට සාපේක්ෂව වත්කම් ක්ෂය වීම් ඇතුළු වෙනත් වියදම් රු. මිලියන 2.05 ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

වසර 2021 දී රු. මිලියන 19.20 ක ශුද්ධ අතිරික්තයක් පෙන්නුම් කර ඇති අතර එය වසර 2020 ට සාපේක්ෂව 80% ක අඩු වීමක් විය. විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දෙන ප්‍රදානයන්හි අවසන් වීම 2021 වසරේ මෙවැනි දැඩි පසුබෑමකට ලක්වී මට හේතු විය. 2022 වසරේ නිම කිරීමේ අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතියේ දෙවැනි අදියර වර්ෂය තුළ දී ආයතනයේ අරමුදල්වලින් ක්‍රියාත්මක කෙරුණි.

කොවිඩ් - 19 වසංගතය සහ වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් රටේ සමස්ත ආර්ථිකය ම කඩා වැටුණ ද, 2021 වසරේ දී ආයතනයේ ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක් තුළ රඳවා ගැනීමට කළමනාකාරිත්වය සමත් වී ඇත.

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ මූල්‍ය තත්ත්වයේ විචලනය වගු අංක 12හි සඳහන් කර ඇත.

	2021 රු. මිලි.	2020 රු. මිලි.	වෙනස රු. මිලි.	ප්‍රගතිය
මුළු වත්කම්	1,085.47	978.14	107.33	10.97%
ජංගම වත්කම්	230.77	272.01	(41.24)	-15.16%
ජංගම වගකීම්	32.78	28.11	4.67	16.62%
ජංගම නොවන වත්කම්	854.70	706.12	148.58	21.04%
ශුද්ධ වත්කම්	1,045.53	940.68	104.85	11.15%
ජංගම අනුපාතය	7.04	9.67	-1.89	-19.54%

වගු අංක 12

වසර 2021දී මුළු වත්කම්වල වටිනාකම රු. මිලියන 1,085.47 දක්වා වැඩි වී ඇති අතර එය 10.97 % ක ප්‍රගතියක් වාර්තා කර තිබුණු අතර ජංගම වත්කම් රු. මිලියන 272.01 සිට රු. මිලියන 230.77 දක්වා අඩු වී තිබුණේ 15.16% ක ප්‍රතිශතයකිනි. දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතියේ උපයෝජනය සඳහා බැංකුවේ තැන්පත් කර තිබුණු කෙටි කාලීන තැන්පතු මුදල් බවට හැරවීම හේතුවෙන් ජංගම වත්කම් අඩු වී තිබුණි. කෙසේ වුව ද, දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතියේ ආයෝජනය කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල අගය රු. මිලියන 706.12 සිට රු. මිලියන 854.70 දක්වා වැඩි වී තිබුණි. ඉහත සඳහන් වූ සංවර්ධන ව්‍යාපෘතියේ ගෙවිය යුතු වටිනාකම් වැඩි වීම හේතුවෙන් ජංගම වගකීම් ද 16.62%කින් වැඩි වී තිබුණි. එබැවින් වසර 2020 ට සාපේක්ෂව ජංගම අනුපාතයේ 19.54% ක අඩු වීමක් නිරූපණය විණි. කෙසේ වුව ද, එයින් ජංගම අනුපාතය 7.04 ගුණයක් ලෙස ස්ථාන ගත වීම සඳහා අවශ්‍ය හිතකර සහ යහපත් මූල්‍ය තත්ත්වයක් නියෝජනය විය.

ශුද්ධ වත්කම්

2021 වසරේ දී 11.15 % ක ප්‍රගතියක් වාර්තා කරමින් ශුද්ධ වත්කම් රු. මිලියන 1,045.53 දක්වා වැඩි වී තිබුණි. 2021 වසරේ සිදු වූ මෙම වර්ධනයට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කළ ආයෝජනය සහ ප්‍රාග්ධන වත්කම්වල වර්ධනය ධනාත්මක ලෙස බලපා තිබුණි. 2021 වසරේ දී රු. මිලියන 19.20 ක අතිරික්තයක් උත්පාදනය කර ගැනීමට ආයතනයට හැකි විය. 2014 වසරේ සිට 2021 වසර දක්වා ශුද්ධ වත්කම් වර්ධනයේ රටාව පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.



ප්‍රස්තාර 4

ද්‍රවශීලතා තත්ත්වය

2021 වසර අවසන් වන විට ආයතනයේ ජංගම අනුපාතය එක් එක් ජංගම වගකීම සඳහා 7.04 ගුණයක් වූ අතර එය එම වසර අවසානයට ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පෙන්නුම් කිරීමට හේතු විණි.

දේපල, පිරියත සහ උපකරණ සඳහා ආයෝජනය

ආයතනය විසින් 2021 වසර තුළ දී රු. මිලියන 35.15 ක් වටිනා ස්පෘශ්‍ය වත්කම් ද, රු. මිලියන 1.6ක් වටිනා අස්පෘශ්‍ය වත්කම් ද අත්පත් කර ගන්නා ලදී. ඒ අනුව, 2021 වසර අවසානය වන විට ස්පෘශ්‍ය දේපළ, පිරියත සහ උපකරණවල ශුද්ධ අගය රු. මිලියන 550.54 ක් ලෙස වාර්තා විය.

තවද, නුදුරු අනාගතයේ උපාධි පිරිනැමීමේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය විසින් තම පුහුණු කිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. ව්‍යාපෘතියේ පළමු අදියර, වසර 2017 සිට වසර 2020 දක්වා කාල පරිච්ඡේදය තුළ දී ලද එකතුව රු. මිලියන 216.9 ක් වූ රජයේ මූල්‍ය ආධාර උපයෝජනය කරමින් 2020 වසරේ දී නිම කරන ලදී. 2021 වසර අවසන් වන විට ව්‍යාපෘතිය ඉක්මවූ කෙරී ගෙන යන වැඩ වටිනාකම රු. මිලියන 299ක් විය. ව්‍යාපෘතියේ දෙවන අදියර 2021 වසරේ දී ආයතනය විසින් උත්පාදනය කර ගත් අරමුදල්වලින් ආරම්භ කර ඇත.

භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රතිරූපීව ප්‍රාග්ධන වියදම්වල සාරාංශය

2021 වසර සඳහා රු. මිලියන 40.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෙසේ වුව ද, 2021 වසරේ දී රජයට මුහුණ දීමට සිදු වූ විවිධ සීමා වීම් හේතුවෙන් භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු තත්‍ය ප්‍රදානය රු. මිලියන 34.00ක් වූ අතර එමඟින් දරා ඇති මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 34.00ක් විය. එබැවින්, 2021 වසර සඳහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදානයේ ප්‍රගතිය 100%ක් වූ අතර ප්‍රාග්ධන වියදම මූල්‍යනය කිරීම සඳහා උත්පාදනය වූ ආදායමෙන් රු. මිලියන 8.85 ක මුදලක් ආයෝජනය කිරීමට ආයතනයට සිදු විය.

2021 වසරේ දී දරන ලද ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර පහත වගු අංක 13න් පෙන්නුම් කෙරේ.

අනු අංකය	ව්‍යාපෘතිය	වියදම 2021 (රු. මිලි.)
	ආයතනයේ ව්‍යාපෘති	
1.0	ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංවර්ධනය	
1.1	ආයතනයේ නේවාසිකාගාර ගොඩනැඟිලි, මලාපවාහන සහ ජල වහන පද්ධති වැඩි දියුණු කිරීම	5.385
1.2	වාහන එන්ජින් සහ විශාල වැඩිදියුණු කිරීම්	2.000
1.3	ඉගනුම් මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීම්	1.085
	එකතුව	8.470
2.0	උපකරණ/ යන්ත්‍රසූත්‍ර සහ පොත්පත් සපයා ගැනීම	
2.1	පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම	2.050
2.2	දේශන ශාලා සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ ශ්‍රවණාගාර සහ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම	2.484
2.4	පුහුණු කටයුතු සඳහා ලැප්ටොප් පරිගණක	1.006
2.5	නේවාසිකාගාරය සඳහා හැඳි, ගෑරුප්පු, පිඟියා ආදිය මිල දී ගැනීම	0.500
2.6	පුස්තකාල පොත්	2.661
2.7	CEB ට්‍රාන්ස්ෆෝමරය සවිකිරීම, කේබල් එළීම සහ ට්‍රාන්ස්ෆෝමර් කාමරය සඳහා වැඩබිම සකස් කිරීම	14.212
	එකතුව	22.913
3.0	ධාරිතා වර්ධනය	
3.1	කුඩා වතුභිමියන් සඳහා වූ ධාරිතා වර්ධන වැඩසටහන	2.618
	එකතුව - භාණ්ඩාගාර අරමුදල්	34.000

වගු අංක 13

2021 වසර තුළ ආයතනය විසින් මුහුණ දුන් සංරෝධක

ආයතනයක් ලෙස පමණක් නොව සමස්ත රටක් ලෙස ද කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ බලපෑම මත 2021 වසර තුළ සැලකිය යුතු කාලයක් සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු නතර කිරීමට සිදු විය. ආයතනයේ සියලු මෙහෙයුම් කටයුතු තාවකාලිකව අත්හිටු වීමට සිදු විය. වැවිලි ක්ෂේත්‍රයේ පුහුණු වීම්වලින් වැඩි කොටසක් ප්‍රායෝගික අධ්‍යාපනික ක්‍රියාකාරකම් මත පදනම් වී ඇති බැවින් ඊට අදාළ වැදගත් අංශ ආවරණය කිරීම සඳහා සහභාගී වීමට සිසුන්ට නො හැකි විය. විශේෂයෙන් කුඩා වතු හිමියන් සඳහා වූ ධාරිතා වර්ධන වැඩ සටහන වැනි වැදගත් වැඩ සටහන් කිහිපයක් නතර කර එම වැඩ සටහන් අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය.

නිරෝධායනයට ලක් වීම හේතුවෙන් අනිවාර්ය නිවාඩු ගැනීමට සිදු වීම සහ නිරෝධායන ඇඳිරි නීතිය පැණවීම නිසා ඇති වූ සේවක හිඟය මත වසර 2021 දී විශාල අභියෝගාත්මක තත්ත්වයකට මුහුණ දීමට ආයතනයට සිදු විය. සංස්ථාපිත අංශයේ වැවිලි සමාගම් මෙන් ම පෞද්ගලික අංශයේ වෙනත් ආයතන ද කාර්යාලවල සහ රැකියා ස්ථානවල රැඳී සිටීමට නො හැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රම හිඟය සහ කාර්ය මණ්ඩලය අඩු වීම හේතුවෙන් ගැටලුවලට මුහුණ දීමට සිදු විය. මෙම ගැටලුව ආයතනයේ අධියයන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කර තිබුණි.

තවද කොවිඩ් වසංගතය පැතිරීම මත වසර 2020 සිට ගෝලීය ආර්ථිකයේ ඇති වූ බිඳ වැටීමේ සෘණාත්මක ප්‍රතිඵලවලට මුහුණ දීමට ආයතනයට සිදු විය. විදේශ විනිමය ඌනතා සම්බන්ධයෙන් ඇති වූ ගැටලුවලින් හට ගත් අධි උද්ධමන තත්ත්වය, ගොඩනැඟිලි ද්‍රව්‍ය සහ ආනයනික ද්‍රව්‍ය මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම කෙරෙහි බලපා තිබුණි. මෙම තත්ත්වය ඉදිකිරීම් සඳහා වන පිරිවැය වැඩිවීමටත්, ක්‍රියාකාරී සැලැස්මේ සහ අයවැයෙහි දක්වා ඇති ඉලක්ක ළඟා කර ගැනීම ප්‍රමාද වීමටත් හේතු විය. ඉහතින් සඳහන් කළ හේතු මත දේශන ශාලා සහ R&D ඒකක සහිත නව ගොඩනැඟිල්ලේ ඉදිකිරීමේ අදියර ප්‍රමාද වූ අතර නව ගොඩනැගිල්ල නිම කිරීමේ දිනය දීර්ඝ කිරීමට සිදු වනු ඇතැයි යන උපකල්පනය මත ව්‍යාපෘතියෙන් භාර දිය හැකි උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය අපේක්ෂා කළ කාල පරිච්ඡේදයෙන් ඔබ්බට, එනම් වසර 2022 දක්වා කල් ගත වනු ඇත.

ඉගනුම් මධ්‍යස්ථානයේ ධාරිතාව වරකට දලු කිලෝ ග්‍රෑම් 300ක් වේ. පොල් සහ රබර් වැනි අනෙකුත් ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ද එම තත්ත්වයේ ඉගනුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමට ආයතනය විසින් සැලසුම් සකස් කරමින් පවතී.

කාර්යභාරය වැඩිදියුණු කිරීම සඳහා මධ්‍ය කාලීන ක්‍රමෝපාය

අංකය	ක්‍රමෝපාය
i	උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් පිහිටුවීම තුළින් වැවිලි කර්මාන්තයේ සංවර්ධනය සඳහා ආයතනයේ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම
ii	තෝරා ගත් පාඨමාලාවල විෂය මාලා SLQF සහ NVQ ප්‍රමිතීන් යටතේ උපාධි මට්ටම දක්වා සංවර්ධනය කිරීම
iii	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුව සහිත පාඨමාලා හඳුන්වා දීම සහ පෙළගැස්වීම
iv	දේශීය සහ විදේශීය පුහුණුව ලබා දීම මඟින් වැවිලි කර්මාන්තයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම
v	නිෂ්පාදනය සහ සැකසීමේ දී වඩාත් පිරිසිදු නිෂ්පාදන ලබා දීම මෙන් ම හරිත තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිපුණතාව ලබා දීම
vi	ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම මඟින් කුඩා වතුහිමියන්ගේ නිපුණතාව ඉහළ නැංවීම
vii	නවීන කළමනාකරණ ශිල්ප ක්‍රම සහ දැනුම තුළින් වැවිලි කර්මාන්තයේ නව ව්‍යවසායකත්වය දිරිමත් කිරීමට
viii	වැවිලි කළමනාකරණයට අදාළ R&D පැවැත්වීම සහ සොයා ගැනීම් ප්‍රචාරය කිරීම
ix	වැඩසටහන් පැවැත්වීම සඳහා පිළිගත් දේශීය සහ විදේශීය අධ්‍යයන ආයතන සමඟ එක්ව කටයුතු කිරීම
x	වෘත්තීය වැවිලි කරුවන් වීම සඳහා වැවිලි කර්මාන්තයට සම්බන්ධ පිරිසට වරලත් සාමාජිකත්වය හඳුන්වා දීම
xi	වැවිලි කර්මාන්තයේ රැකියා අවස්ථා අවශ්‍යතාව සපුරාලීම සඳහා තරුණ ප්‍රජාවගේ කුසලතා සංවර්ධනය කිරීම
xii	වැවිලි අංශයට මෙන් ම රටට ද එක සේ වැදගත් වන පස සංරක්ෂණය කිරීම සහ කෘමීන් (මී මැස්සන් වැනි) සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
xiii	ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. උදා:- NIPM ඉගනුම් මධ්‍යස්ථානයේ තේ සැකසුම් ඒකකය
xiv	තේ රස බැලීම වැනි නව පාඨමාලාවක් වැවිලි කර්මාන්තයට හඳුන්වා දීම

නිගමනය

කොවිඩ් - 19 වසංගතයේ ව්‍යාප්තියත් සමඟ ආයතනයේ මෙහෙයුම් කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු වුව ද, තම මූල්‍ය ස්ථාවරභාවය රඳවා ගැනීමට ආයතනය සමත් විය. කෙසේ වුව ද රජය විසින් ගැටලුවලට මුහුණ දී සිටිය දී පවා පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. මිලියන 93.36 ක මුදලක් 2021වසර තුළ දී අප වෙත ලබා දුන් බව ප්‍රකාශ කරන්නේ සතුටිනි. 2021 වසර අවසන් වන විට ශුද්ධ වත්කම්වල අගය රු. මිලියන 1,045.53 දක්වා වැඩි වී ඇත.

සමස්ත ලෝකය ම මෙම වසංගත තත්ත්වයට මුහුණ දීම නිසා පුහුණු කටයුතුවලින් ලැබූ ආදායම අඩු වී තිබූ වාතාවරණයක් තුළ මෙම පිළිගත් පුහුණු වැඩ සටහනේ න්‍යායාත්මක කොටස මාර්ග ගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට සිදු වූ අතර එමඟින් විධිමත් අයුරින් පාඨමාලා මොඩියුල සමාලෝචනය කිරීමක් ද

සිදු කෙරිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස තෝරා ගත් පාඨමාලා කිහිපයක ම නව ගාස්තු සංශෝධනය මඟින් එම පාඨමාලා ගාස්තු යම් ප්‍රමාණයක් අඩු කිරීමට හැකි විය. ඒ අනුව, මාර්ග ගත වැඩමුළු 35ක් ද ඇතුළු වැඩසටහන් 56ක් පැවැත්වීමට ආයතනය සමත් විය.

වාර්තාගත කාල පරිච්ඡේදය තුළ දී NVQ 4 වන මට්ටමේ සිට NVQ 6 වන මට්ටම දක්වා වන පාඨමාලා වැඩිදියුණු කිරීමට ආයතනයට හැකි වූ අතර NVQ 4 වන මට්ටම සඳහා හඳුන්වා දෙන ලද සංකල්පය වන 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශේෂයෙන් සංවර්ධනය කර ඇත්තේ අ.පො.ස. (සා.පෙ.) විභාගයට සාර්ථකව මුහුණ දීමට නො හැකි වූ සිසුන් සඳහා ය. ආයතනය විසින් 2021/22 වන විට NVQ 7 වන මට්ටම ලබා ගැනීමේ වේගවත් ඉලක්කය සඳහා වන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය ලෙස අධ්‍යාපනික සහ පුහුණු යටිතල පහසුකම් ඇතුළු ආයතනයේ සියලු පහසුකම් වැඩිදියුණු කළ යුතු ය.

වසර 2030 වන විට සපුරා ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු අතුරින් අරමුණු අංක 04 වන ගුණාත්මක අධ්‍යාපනය මෙන් ම අරමුණු අංක 08 වන ආර්ථික වර්ධනය ද ළඟා කර ගැනීමේ දී රාජ්‍ය ආයතනයක් ලෙස ජාතික වැවිලි කළමනාකරණ ආයතනයට පැවරී ඇත්තේ භාරදූර වගකීමකි.

පාලක මණ්ඩලයේ මෙන් ම ආයතනයේ ද සභාපතිවරයා වශයෙන් 2021 වසර තුළ දී අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමේ දී සහය දුන් සියලු දෙනාට ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ඒ.එල්.ඒ.අසෝක සිරිවර්ධන

සභාපති/N.I.P.M

2022.04.20

2021

මූල්‍ය වාර්තා

පටුන

මූල්‍ය වාර්තා	පිටුව
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්	51 - 61
මූල්‍ය තත්ව ප්‍රකාශනය	62 - 63
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	64
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	65 - 66
ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	67 - 68
අයවැය සහ සත්‍ය කාර්ය සාධනය	69
සටහන් හා උපලේඛණ	70 - 75
දේපල පිරියත හා උපකරණ ලේඛණය	76 - 77
අස්පෘශ්‍ය වත්කම් ලේඛණය	78
සටහන් හා උපලේඛණ	79 - 94
ඛණ්ඩන වාර්තාව	95 - 96
මූල්‍ය උපනතීන්	97 - 98
විගණකාධිපති වාර්තාව	99 -108

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

2021 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

1.0 වාර්තාකරණ අස්ථිත්වය

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සංස්ථාපනය කරන ලද මෙම ආයතනය 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 සංශෝධනයන් මඟින් වඩාත් ඵලදායී ශක්තිමත් රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සවිබල ගන්වා ඇත.

ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලාවන් සාර්ථකව නිම කරන අයවලුන් සඳහා සහතික පිරිනැමීම, සුදුසුකම්ලත් වැවිලි විධායකයින් වෙත වෘත්තීය සාමාජිකත්වය ලබා දීම සඳහා බලයලත් එකම ආයතනය ලෙස මෙම පනත හා සංශෝධනයන් මඟින් බල ගන්වා ඇත. මෙම ආයතනය තේ, රබර්, පොල්, උක්, කජු, කුරුඳු සහ තල් වැනි වැවිලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමියන් ඇතුළුව එම වැවිලි ක්ෂේත්‍රයේ සේවයේ නියුක්තවූවන්ගේ වෘත්තීය නිපුණතාව උසස් මට්ටමින් පවත්වා ගෙන යාම පිළිබඳව සහතික වන අතර ඒ වෙනුවෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විවිධ වැඩමුළු, දේශණ හා විභාගයන් පැවැත්වීම හා පර්යේෂණ සිදු කිරීම හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් වෙත උපදේශණ සේවා ලබා දීම සිදු කරනු ලැබේ. ආයතනය දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල සමග එකතුව සාමූහිකව වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලා පැවැත්වීම සිදු කරන අතර විදේශීය සිසුන් සඳහා පාඨමාලා සංවිධානය සඳහා හැකියාව ආයතනය සතුව පවතී.

ආයතනයේ ලියාපදිංචි කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

2.0 පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය විසින් ප්‍රකාශිත රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව උපචිත පදනම මත මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත. මූල්‍ය වාර්තාවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, කාර්ය සාධන වාර්තාව, ශුද්ධ වත්කම් විචලනය පිළිබඳ වාර්තාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ අයවැය හා සත්‍ය කාර්ය සාධන වාර්තාව සමග වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුළත් කර ඇත.

2.2 ඇගයීමේ පදනම

මූල්‍යය ප්‍රකාශනයන් පහත සඳහන් වැදගත් අයිතම හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනම්ව පිළියෙල කර ඇත.

- වාහන අගයන් ප්‍රත්‍යාගණන පදනම යටතේ ඉදිරිපත් කර ඇත.
- 2014 වසරේ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත සඳහා අනුගත වීමේ දී එදිනට පැවති දේපල උපකරණ හා පිරියත ප්‍රත්‍යාගණනය කර හෙලිදරව් කර ඇත. පසුව මිළදී ගනු ලබන වත්කම් කාලීන වාර්ෂික වාර්තාකරණ කාලය සඳහා පිරිවැය පදනම බල පැවැත්වේ. 2014.12.31 දින බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ දේපල ප්‍රත්‍යාගණනය කර 2015 සිට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇත.
- සේවක විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ආයු ගණක පදනම මත අගය කර ඇත.
- අතුරුගිරිය ප්‍රධාන කාර්යාලයේ ඉඩම 2019 වසරේදී නැවත ප්‍රත්‍යාගණනය කර මූල්‍ය වාර්තා වල ඇතුලත් කර ඇත. බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම 2015 දී නැවත තක්සේරු කර 2021 දී ගිණුම් වාර්තාවල පෙන්නුම් කර ඇත.

2.3 මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශිත විනිමය

ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදල් වන ශ්‍රී ලංකා රුපියල් මඟින් මූල්‍ය ප්‍රකාශණ ප්‍රකාශ කර ඇත.

3.0 <u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය</u>

අවිච්ඡින්න පැවැත්මේ සංකල්පය මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අතර, මෙම සංකල්පය ගිණුම්කරණ කාල සීමාව පුරා අඛණ්ඩව ශේෂයන් සඳහන් කර නොමැති තත්ත්වයක් තුළ අදාළ රාජ්‍ය ප්‍රදාන පුහුණු වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, උපදේශන සේවා භාර ගැනීම, වාර්ෂික සාමාජික දායක මුදල් හා ප්‍රකාශන අලෙවිය තුළින් අරමුදල් සම්පාදනය කර ගනු ලැබේ. මෙමඟින් රැස් කරන සමුච්චිත අරමුදල් ආයතනයේ අවශ්‍යතාවය අනුව වගකීම් පියවීම හැකි පරිදි උපයෝගී කර ගනු ලැබේ.

3.1 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට සමුච්චිත ක්‍රමක්ෂය හා අපහායනයන් අඩු කිරීමෙන් පසු වාර්තා කරනු ලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමය උපයෝගී කර ගෙන අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනු ලැබේ. ඇස්තමේන්තුගත ජීවිත කාලය වාර්ෂිකව වාර්තා කරන කාල සීමාවන්හි විමර්ශනයට භාජනය කරන අතර එහි කිසියම් වෙනසක් වේ නම් පිරික්සුම් අගය පදනම්ව ගිණුම් ගත කරනු ලැබේ.

<u>පරිගණක මෘදුකාංග</u>

ආයතනය විසින් සංවර්ධිත ගිණුම්කරණ මෘදුකාංගය, වැටුප් පිළියෙල කිරීමේ මෘදුකාංග, පුහුණු දත්තයන් සහ සම්පත් කළමනාකරණ මෘදුකාංගයන් පරිගණකයෙහි මෙහෙයුම් පද්ධතියක කොටසක් නොවන අතර, අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන ඇත. මෙම වත්කම් වසර 4 ක් තුළ ගිණුම් පොත්වලින් ලියා හැරීම සිදු කරනු ඇත.

<u>දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය</u>

දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය සඳහා වැය වන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර, සංවර්ධිත විෂයමාලාවන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 4 ක් ලෙස සැලකිල්ලට ගෙන ගිණුමෙන් ලියා හැරීමට කටයුතු කරනු ඇත.

<u>ආයතනයේ තේමා ගීතය</u>

ආයතනය විසින් දර්ශන සහිතව තේමා ගීතයක් නිර්මාණය කර ඇති අතර පිරිවැයේ ස්වභාවය සහ සංගීත අධ්‍යක්ෂණය සඳහා වැය පිරිවැය ගණනය සිදු නොවන අතර අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකනු ලබන අතර ඒ සඳහා අවිනිශ්චිත ආයු කාලයක් පවතී. එබැවින් මෙම අස්පෘශ්‍ය වත්කම සඳහා ක්‍රමක්ෂය ගිණුමෙන් ලියා හැරීමක් සිදු නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීව කාලය පහත සඳහන් පරිදි ඇස්තමේන්තු ගත කර ඇත.

විස්තරය	පරිගණක මෘදුකාංග	දුරස්ථ අධ්‍යාපන පාඨමාලා සංවර්ධන පිරිවැය	NIPM තේමා ගීතය
ප්‍රයෝජනවත් ජීව කාලය	වසර 04	වසර 04	අදාළ නොවේ

3.2 කුඩා වතු හිමියන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්

කුඩා වතු හිමියන් සඳහා පවත්වන ධාරිතා සංවර්ධන වැඩසටහන් ප්‍රාග්ධන සංවර්ධන පිරිවැයක් ලෙස සලකනු ලබන අතර ඔවුන්ගේ දැනුම වර්ධනය වීමට හේතු පාදක වීම හා කුඩා වතු හිමියන්ගේ හැකියාවන් වර්ධනය වී ඇත. අවසාන පාරිභෝගිකයාගේ දෑතට ගුණත්වයෙන් ඉහළ නිෂ්පාදනයන් ලබා දීම පෙරදැරිව කුඩා වතු හිමියන්ගේ කෘෂිකාර්මික දැනුම අපේක්ෂිත මට්ටමට සංවර්ධනය සඳහා කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා මෙම වැඩසටහන් සංවිධානය කරන බැවින් මෙමඟින් ආයතනයේ කීර්තිනාමය සහ ආයතනය ප්‍රවර්ධනය සඳහා ද හේතු පාදක වී ඇත.

මෙම වැඩසටහනට අමතරව වැවිලි ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන පාසැල් හැර ගිය සිසුන් සඳහා NVQ සහතිකය ලබා ගැනීමට හැකි පරිදි ඔවුන්ගේ කුසලතා වැඩි කිරීම පෙරදැරිව ආයතනය විසින් පාඨමාලා සංවිධානය කරනු ලැබේ.

මෙම වැඩසටහන්හි ප්‍රතිඵල අදාළ වර්ෂය තුළ දී උපලබ්ධි වන බවට උපකල්පනය කරන අතර, එම නිසා ආයෝජිත පිරිවැය එම වර්ෂයේ දී ම ලියා හරිනු ලැබේ.

2021 වසරේ ජාතික අයවැය මඟින් රු: මිලියන 2.617 ක මුදලක් වැය කර කුඩා වතු හිමියන්ගේ සහ කම්කරුවන්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් 114 ක් පවත්වා ඇති අතර, 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ පාසැල් හැර ගිය සිසුන් වෙනුවෙන් NVQ 4 මට්ටමේ පාඨමාලා 02 ක් සංවිධානය කර එම කටයුතු සාර්ථකව සිදු කර ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කුඩා වතු හිමියන්ගේ වැඩසටහන් බොහොමයක් 2022 වසර දක්වා කල් දමන ලදී.

3.3 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අපහායනයන් අඩු කිරීමෙන් පසු අගය පෙන්නුම් කර ඇත. වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කරන තුරු වන සියලු සෘජු පිරිවැය මෙන්ම සැලකිය යුතු මට්ටමේ මහා පරිමාණ අළුත්වැඩියාවන් මෙම ඓතිහාසික පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපල පිරියත හා උපකරණයන්හි එක් එක් අයිතමයන්ගේ ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි වෙනස්කම් පවතින අතර ඒවා වෙන් වශයෙන් සැලකිල්ලට ගෙන ප්‍රයෝජනවත් ජීවිත කාලය අනුව ක්ෂය ගණනය කිරීම සිදු කෙරෙනු ලැබේ.

3.3.1. ප්‍රයෝජනවත් ජීව කාලය

සරල මාර්ග ක්‍රමය පදනම්ව ක්ෂය ගණනය කිරීම කරන අතර, වත්කමේ ජීවිත කාලය සැලකිල්ලට ගෙන පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කර ඇස්තමේන්තුගත ක්ෂය අගය වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ගිණුම්වලින් කපා හරිනු ලැබේ.

ප්‍රවර්තන හා පෙර වර්ෂ සඳහා අදාළ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ උපයෝගී කර ගත් ක්ෂය අනුපාතයන් පහත සඳහන් වේ. මෙම අනුපාතයන් ව්‍යාතිරේඛයන් යටතේ විශේෂයෙන් සඳහන් නොවන අවස්ථාවන්හි දී පොදුවේ භාවිතා වේ.

නිදහස් ගොඩනැගිලි	අවු. 20	5%
කාර්යාලීය ලී බඩු	අවු. 10	10%
මෝටර් වාහන	අවු. 05	20%
මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකථන (යටිතල වත්කම්)	අවු. 10	10%
පුස්තකාල පොත්	අවු. 10	10%

<u>ව්‍යාතිරේඛයන්</u>

- උපකරණ යටතේ යන්ත්‍ර සූත්‍ර, කාර්යාලයීය උපකරණ සහ නේවාසිකාගාර ගෘහ උපකරණ හා භාණ්ඩ ඇතුළත් වේ. මෙම අයිතමයන්හි ජීව කාලය එකිනෙකට වෙනස් වන අතර එය පහත සඳහන් පරිදි තක්සේරු කර ඇත.

යන්ත්‍ර සූත්‍ර	වසර 5
කාර්යාලයීය උපකරණ	වසර 5
වෙනත් උපකරණ	වසර 4

- පරිගණක ජාලකරණය, යටිතල වත්කම් ලෙස වර්ගීකරණය කර පැවතිය ද ප්‍රයෝජනවත් ජීව කාලය වසර 5 ක් ලෙස ගණනය කර ඇත.

- 150 KVA විදුලි ජනක යන්ත්‍රය හා පිරියත යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 10 ක් ලෙස සැලකිල්ලට ගෙන ඇත.

- 2019 වර්ෂයේ සිට තිරරෙදි සහ නේවාසිකාගාරයේ උපකරණ හා පිඟන් භාණ්ඩ ආදිය පාරිභෝගික වත්කම් ලෙස හඳුනා ගෙන වාර්ෂිකව පාරිභෝජන පිරිවැය ගණනය සඳහා යොදා ගනු ලැබේ.

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව යටිතල වත්කම් සඳහා පහත සඳහන් දෑ ඇතුළත් කර ඇත.

- මාර්ග සංවර්ධන වියදම්
- ජල සැපයීමේ හා බල උත්පාදන වියදම්
- විදුලි සැපයීමේ වියදම්
- පරිගණක ජාලකරණය

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ අවශේෂ වටිනාකම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම විමර්ෂණයට භාජනය කර නියමිත ගැලපිලි අවස්ථානුකූලව සිදු කරනු ලැබේ.

3.3.2 මිනුම්කරණ පදනම

වාහන හැර අනෙකුත් සියලුම වත්කම් පිරිවැය පදනම අනුව ක්ෂය කරන අතර වාහන ප්‍රත්‍යාගනන පදනම මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ආයතනය සතු ඉඩම් ක්ෂය කිරීම සිදු කරනු නොලැබේ.

3.3.3 අපහරණය කිරීම

දේපල පිරියත උපකරණයන්හි අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති වීම අපහායනයෙන් භාවිතයෙන් ඉවත් කළ විට විකුණා ලැබෙන මිළ හා රැගෙන එන වටිනාකම සසඳා ලාභය හෝ පාඩුව තීරණය කරනු ලැබේ. මෙමඟින් ජනිත වන ලාභය හෝ පාඩුව මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ අන්තර්ගත කරනු ලැබේ.

3.3.4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

ආයතනය වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පවත්වා ආර්ථිකමය වශයෙන් භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

3.3.5. ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගත් ඉඩම් වල වර්තමාන තත්ත්වය

ආයතනය සතු වූ හෙක්ටයාර 1.9499 ක් වන භූමි ප්‍රමාණය සහ නිල නිවාස 03 ක අයිතිය ශ්‍රී ලංකා යුධ හමුදාවේ 7 වෙනි ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙත පවරා ඇත. මෙම ඉඩමේ අයිතිය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ පවරා ගෙන ඇත. 2018 ඔක්තෝම්බර් මාසයේ රු: මිලියන 155.2 ක වන්දි මුදලක් මෙම පවරා ගැනීම වෙනුවෙන් වන්දි වශයෙන් ආයතනයට ගෙවා ඇති අතර, ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලි. 42.59 ක මුදලක් ද 2021 දී ලබාදෙන ලදී. ආයතනය ස්වාධීන උපාධි පිරිනැමීමේ ආයතනයක් දක්වා සංවර්ධනය කිරීමේ

2017 සිට 2022 දක්වා ඉදිවෙමින් පවතින ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා මෙම මුදල වැය කිරීම වෙනුවෙන් බැංකුවේ තැන්පත් කර ඇත.

4.0 යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඇති තැන්පතු

යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා සපයන ආයතනයන් ඉදිරිපත් කර ඇති සුරක්ෂිත තැන්පතු මේ සඳහා ඇතුළත් වේ.

5.0 තොගයන්

ආයතනයේ ප්‍රකාශන, මුද්‍රණ උපකරණ, ලිපි ද්‍රව්‍ය, කාර්යාල අවශ්‍යතා, ටයර්, ගොඩනැගිලි නඩත්තු උපකරණ සහ වෙනත් පාරිභෝග පරිහරණ ද්‍රව්‍යයන් තොගයේ අන්තර්ගත වේ. තොග ගණනය ප්‍රථම නිකුතු ප්‍රථම මිළ ක්‍රමය සැලකිල්ලට ගෙන ගණනය කරනු ලැබේ. තේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදානය කළ පොත්වල වටිනාකම ප්‍රකාශන තොගයේ ඇතුළත් කර ඇත.

යොදාගත් පිරිවැය සමීකරණය = "ගත්මිළ + ගැලපුම් පිරිවැය + අනෙකුත් පිරිවැය"

තොගයන්හි රැගෙන එන වටිනාකම පහත ලැයිස්තු ගත කර ඇත.

අයිතමය	රැගෙන එන වටිනාකම ධාරණ අගයට රුම්ලියන .	විකිණීමට පිරිවැය	රැගෙන එන සාධාරණ අගය රුම්ලියන .
ලිපිද්‍රව්‍ය	647,240.20	-	647,240.20
මුද්‍රණ උපකරණ	1,385,651.80	-	1,385,651.80
සුභ සාධන අයිතම	55,794.00	-	55,794.00
පාරිභෝගික අයිතම	165,705.20	-	165,705.20
ගොඩනැගිලි නඩත්තු උපකරණ	139,367.50	-	139,367.50
ප්‍රකාශන	813,450.00	-	813,450.00

පිගන්, හැඳි ගෑරුප්පු නේවාසිකාගාරයේ මුළුතැන්ගෙයි සුළු උපකරණ සහ පරීක්ෂණාගාර උපකරණ

රෙදි අයිතම	1,294,402.50	-	1,294,402.50
හැඳි ,ගෑරුප්පු සහ පිගන්	719,557.50	-	719,557.50
පරීක්ෂණාගාර උපකරණ	92,902.50		92,902.50
එකතුව	5,314,071.20	-	5,314,071.20

ප්‍රදානය කළ ප්‍රකාශනයන්

ප්‍රදානය කරන ලද ප්‍රකාශන පොත් වටිනාකම ප්‍රකාශන තොගයේ අන්තර්ගතය, ප්‍රදාන වටිනාකම විලම්භිත ආදායම් යටතේ ජංගම වගකීම්වල පෙන්නුම් කර ඇත. ආදායම අදාළ වර්ෂය තුළ දී උපලබ්ධි වන ආකාරය අනුව ගිණුම් ගත කරනු ලැබේ.

6.0 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ අත ඉතිරි මුදල් අතුරුගිරිය ලංකා බැංකුවේ ශාඛාවේ ජංගම ගිණුමේ ශේෂය සහ මාස තුනකට අඩු කෙටි කාලීන තැන්පතු ඇතුළත් ය.

7.0 මූල්‍ය උපකරණ

ණය, ලැබිය යුතු දෑ සහ තැන්පතු ගණුදෙනුව ඇති වූ අවස්ථාවේදීම ආයතනය මූලික වශයෙන් මූල්‍ය උපකරණයක් ලෙස හඳුනා ගන්නා අතර එම මූල්‍ය වත්කම් පරිනත වූ දිනයේ දී මූල්‍ය ප්‍රවාහය තුළට ඇතුළත් කරනු ලැබේ.

කල් පිරෙන තෙක් තබා ගන්නා මූල්‍ය වත්කම්

කල් පිරෙන තෙක් තබා ගැනීමේ අරමුණින් මූලිකව හඳුනා ගනු ලැබූ මූල්‍ය වත්කම් කල් තබා ගන්නා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් මූලිකව හඳුනා ගැනීමේ දී ධාරණ අගයට සෘජුව බලපාන ගණුදෙනු පිරිවැය එකතු කර අපහායණයන් අඩු කර සඵල පොලී අනුපාත ක්‍රමයට ගණනය කරනු ලබයි.
මූල්‍ය වත්කම කල් පිරීමට පෙරාතුව කිසියම් විකිණීමක් හා නැවත වර්ගීකරණය කරනු ලබයි නම් නැවත විකිණීමට ඇති ආයෝජන ලෙස එම ආයතනයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොල මිළ තීරණය සඳහා ඉදිරිපත් නොවන අතර, එම වත්කම් මූලිකව ධාරණ අගයට සෘජුව සම්බන්ධ ගණුදෙනු පිරිවැය එකතු කර අගය කර ඇත. එසේ ගණනය කිරීමෙන් පසු එම ණය හා ලැබිය යුතු දෑ සඳහා සඵල පොලී අනුපාතයට අනුව ක්‍රමක්ෂය ගණනය කර අපහායනය අඩු කර මූල්‍ය වාර්තාවල පෙන්නුම් කරනු ලැබේ.

8.0 සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිත දීමනා

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම නිර්වචිත දායකත්ව සැලසුම මෙන් නොව පසු සේවක ප්‍රතිලාභයන් සඳහා සැලසුම් කර ඇත. ආයතනයේ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම යටතේ පාරිතෝෂිත දීමනා සැලසුම ශුද්ධ වගකීම වාර්ෂික ආයුගණක ක්‍රමය උපයෝගී කර ගෙන ගණනය කර පෙන්නුම්

කර ඇත. ආයතනයේ සියළුම සේවකයින් සඳහා ඔවුන්ගේ විශ්‍රාමික පාරිතෝෂිත දීමනා ඔවුන් සේවයෙන් විශ්‍රාම ගැනෙන අවස්ථාව දක්වා ආවරණය වන පරිදි සැලසුම පිළියෙල කර පිරිවැය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. ආයුගණක කිරීමෙන් පසු ලාභය හෝ පාඩුව ආදායමක් හෝ වියදමක් ලෙස වාර්තාකරන වර්ෂයේ දී ම හඳුනා ගැනේ.

වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල පාරිතෝෂිත දීමනා මුදල ජංගම වගකීම් යටතේ පෙන්නුම් කර ඇත. මුළු පාරිභෝගික දීමනා ප්‍රමාණය හා සමාන අගයක් ලංකා බැංකුවේ තැන්පතු ගිණුම්වල ගෙවීම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ආයෝජනය කර ඇත.

නිර්වචිත දායකත්ව සැලසුම - සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

නිර්වචිත දායකත්ව සැලසුම යටතේ ආයතනය ස්ථාවර දායක මුදලක් සියලු සේවකයින් සඳහා යොදනු ලැබේ. මූලික වැටුපට හා ජීවන වියදම් දීමනා අගයන්හි එකතුව මෙම ගණනය සඳහා උපයෝගී කර ගන්නා අතර ආයතනය විසින් 12% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහාද 3% ක් සේවක භාරකාර අරමුදල සඳහා ද බැර කෙරේ.

9.0 ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට අනුව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කරන අතර ඒ අනුව 2016 සිට මූල්‍ය ප්‍රකාශන සඳහා එම ප්‍රමිතියට අනුව අනුගත කර ඇත. මෙම ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදානයන් ආයතනයේ ආදායමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ

10.0 <u>කෙටි කාලීන වෙන් කිරීම් සහ අසම්භාව්‍යන්</u>

10.1 අසම්භාව්‍ය වගකීම්

විය හැකි හෝ වර්තමානයේ සිදුවිය හැකි වගකීමක් මේ සඳහා මතු නොවීම හේතුවෙන් මූල්‍ය සම්පත් ගලා යාමක් ඇති සිදු නොවීමේ හේතුව මත 2021 වර්ෂයේ මේ සඳහා කිසිදු වෙන් කිරීමක් සිදු කර නොමැත.

10.2 අඩමාන ණය සඳහා වෙන් කිරීම

වර්ෂය අවසාන වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත 6% ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කරනු ලැබේ. සටහන් අංක 47 මඟින් ණය අත්තිකාරම් සහ අනෙකුත් කාලීන තැන්පතු සඳහා මූල්‍ය අවධානම පිළිබඳව අතිරේක තොරතුරු ඉදිරිපත් කර ඇත.

11.0 ආදායම් හඳුනා ගැනීම

පුහුණු ආදායම

11.1 කෙටි කාලීන වැඩසටහන්

පුහුණු කාල සීමාව මාස 06 කට වඩා අඩු නම් එම වැඩ සටහන කෙටි කාලීන වැඩසටහනක් ලෙස වර්ග කරන අතර පුහුණු වැඩසටහන ආරම්භක වර්ෂයේ දී ම මෙහි මුළු ආදායම හා වියදම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

11.2 දිගු කාලීන පුහුණු වැඩසටහන් (ඉදිරියට යන වැඩසටහන්)

පුහුණු කාල සීමාව මාස 06 ට වඩා වැඩි වන්නේ නම් එම වැඩසටහන් දිගු කාලීන වැඩසටහන් (ඉදිරියට යන වැඩසටහන්) ලෙස සලකනු ලැබේ. මෙහි පුහුණු වැඩසටහන්වල ආරම්භක මාසය හා පාඨමාලා කාල සීමාව සැලකිල්ලට ගෙන සමානුපාතික පදනම උපයෝගී කර ගෙන ආදායම් හා වියදම් කාලීන පදනම මත ගිණුම් ගත කෙරේ.

11.3 බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත.

11.4 වෙනත් ආයතන වෙත පහසුකම් කුලියට ලබා දීම

ආයතනය ආදායම් ඉපයීම සඳහා එහි පහසුකම් වෙනත් ආයතනයන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා ලබා දෙනු ලැබේ. ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථයට පරිභාහිරව වෙනත් ව්‍යාපෘතියක් හේතුවෙන් මෙහි ආදායම් හා වියදම් වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ වාර්තා ඇතුළත් කර ඇත.

11.5 රජයේ ප්‍රදාන

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වාර්ෂික අයවැය මඟින් සැලකිය යුතු මුදලක් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් ප්‍රදානය කරන අතර, එම ප්‍රදානයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 ට අනුව ගිණුම් ගත කර ඇත.

12.0 වාර්තාකරණ දිනට පසු සිදුවන සිදු වීම

මූල්‍ය වාර්තා නිකුත් කිරීමට අනුමත කරන දිනය හා වාර්තා කරන අවසාන දිනය අතරතුර සිදුවන හිතකර හා අහිතකර සිදුවීම් වාර්තාකරණ දිනයට පසු සිදුවීම් ලෙස සලකනු ලැබේ. සිදුවන සිදුවීමේ වටිනාකමේ ස්වභාවය මත මෙම සිදුවීම් හෙළිදරව් කළ යුතු හෝ ගැලපිය යුතු කරුණු ලෙස අවශ්‍යතාව අනුව මූල්‍ය වාර්තාවල වාර්තා කරනු ලැබේ.

ගැලපිය යුතු අවස්ථා

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ කළ දිනට පසුව වෙනත් ද්‍රව්‍යමය සිදු වීම් කිසිවක් සිදු නොවීම හේතුවෙන් වෙනත් ගැලපිලි සටහනක අවශ්‍යතාවක් ඇති වී නොමැත.

හෙළිදරව් කළ යුතු අවස්ථා

- VAT ලියාපදිංචිය නිෂ්ක්‍රීය කිරීම

  දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් **2020.01.01** දින සිට බල පැවැත්වෙන පරිදි වගකීම් පිරිවැටුම අදාළ සීමාව ඉක්මවා නොයාම හේතුවෙන් **VAT** බදු අක්‍රීය කර ඇත.

- නව සංවර්ධන ව්‍යාපෘතිය

  ආයතනයේ පුහුණු පහසුකම් උපාධි පිරිනමන ආයතනයක් දක්වා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී. දේශණ ශාලා සහිත පර්යේෂණ හා පුහුණු ඒකක සහිත නව ගොඩනැගිල්ල ඉදි කිරීමේ මුල් අදියර **2020** වසරේ දී අවසන් වූ අතර එහි දෙවන අදියර **2021** වසරේදී ආරම්භ කිරීමට නියමිත ය. ඊට සමගාමීව උපාධි පාඨමාලා තුනක් සඳහා විෂය මාලා සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- උසාවි නඩු

  හිටපු මාණ්ඩලික සහකාර කේ.ජී. නේපාල මහතාගේ විනය හේතූන් මත සේවයෙන් පහ කිරීමට ආයතනයේ කළමනාකාරීත්වය තීරණය කලේය. එම තීන්දුවට එරෙහිව කඩුවෙල කම්කරු විනිශ්චය සභාවේදී නීතිමය ක්‍රියා පටිපාටියට අනුව නඩුවක් ක්‍රියාත්මක වේ.

- බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය

  2020 වර්ෂයේ කොවිඩ් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය භාවිතා කල අතර එය නැවත **2021** වර්ෂයේදී ආයතනයට භාර දී ඇත.

13.0 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සකස් කිරීම

2019.01.01 සිට නේවාසිකාගාරයේ මුළුතැන්ගෙයි උපකරණ හා පිඟන් භාණ්ඩ හා රෙදිමය අයිතම පාරිභෝජන ද්‍රව්‍ය සේ සලකා ගිණුම්ගත කිරීම සිදු කරන අතර වර්ෂය අවසානයේ හඳුනා ගන්නා ලද පළුදු වීම හා අපහායනයන් පාරිභෝජන පිරිවැය යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

14.0 මූල්‍ය අවධානම් කළමනාකරණය

ගණුදෙනුකරුවෙකු හෝ වෙනත් පාර්ශවකරුවෙකු ගිවිසුම්ගත වගකීම පැහැර හැරීම මූල්‍ය අවධානමක් වන අතර, එය ආයතනයට මූල්‍ය අලාභයක් ලෙස හඳුනාගනු ලැබේ. ණයගැතියන්ගේ අවසාන ශේෂය වන **6%**ක වෙන් කිරීමක් සිදු කිරීම මඟින් මූල්‍ය අවධානම කළමනාකරණය සඳහා කටයුතු කරනු ලැබේ.

ණය හා අත්තිකාරම් පොලී ගණනයේ දී වාර්ෂික සඵල පොලී අනුපාතය පදනම්ව ගණනය සිදුකරන අතර, එම සඵල අනුපාතය **2021** වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත වලට අනුව **8.24%**ක් වන අතර **2020** අවසානයේ දී **5.05%** ක් ලෙස ගණනය සඳහා යොදා ගෙන ඇත.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (රුපියල්)

දෙසැම්බර් **31** දිනට

වත්කම්	සටහන්	2021 (රු.පි.)	2020 (රු.පි.)
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	14	**68,061,015.62**	**18,557,323.03**
ලැබිය යුතු දෑ	15	**15,653,022.25**	**19,678,719.31**
තොගයන්	16	**5,314,071.20**	**4,588,910.10**
කලින් ගෙවීම්	17	**8,237,617.95**	**21,257,750.53**
වෙනත් ජංගම වත්කම්	18	**133,508,190.28**	**207,936,454.12**
		230,773,917.30	**272,019,157.09**
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු දෑ	19	**2,080,457.46**	**2,034,328.11**
දේපල, පිරියත හා උපකරණ	20	**550,546,281.33**	**502,498,844.17**
අස්පෘශ්‍ය වත්කම්	21	**2,473,452.71**	**1,326,816.21**
ජංගම නොවන වෙනත් වත්කම්	22	**299,600,229.09**	**200,267,626.69**
		854,700,420.59	**706,127,615.18**
මුළු වත්කම්		**1,085,474,337.89**	**978,146,772.27**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	23	**32,781,437.64**	**27,186,456.42**
කෙටි කාලීන ප්‍රතිපාදන	24	**-**	**357,110.00**
සේවක ප්‍රතිලාභ	25	**-**	**571,010.00**
		32,781,437.64	**28,114,576.42**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	26	**7,055,847.73**	**9,250,014.91**
ආපසු ගෙවන ආරක්ෂිත තැන්පතු	27	**105,364.48**	**96,332.93**
මුළු ජංගම නොවන වගකීම්		**7,161,212.21**	**9,346,347.84**

මුළු වගකීම්		39,942,649.85	37,460,924.26
ශුද්ධ වත්කම්		1,045,531,688.04	940,685,848.01
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
රජය දායක වූ ප්‍රාග්ධනය හා වෙනත් රාජ්‍ය ආයතන	28	35,490,371.21	35,490,371.21
සංචිතයන්	29	459,360,664.04	416,311,660.77
සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)	30	550,680,652.79	488,883,816.03
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		1,045,531,688.04	940,685,848.01

පිටු අංක **47** සිට **57** දක්වා සහ **60** සිට **88** දක්වා සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංඝටනීය කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති බවට සහතික කරමු.

ආචාර්ය කේ. එච්. ජී. එම්. ප්‍රසාද් ධර්මසේන
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි

එල්. ඩී. ජේ. ප්‍රියන්ත
ගණකාධිකාරී

මෙම ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ. එල්. ඒ. අසෝක සිරිවර්ධන
සභාපති
2022.02.28

හසිනි ලක්ධරණි
පාලක මණ්ඩල සාමාජික
අතිරේක ලේකම්
සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය (රුපි.)

දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම	සටහන්	2021 (රුපි.)	2020 (රුපි.)
රජයේ පුනරාවර්තන ප්‍රදාන	31	**59,365,000.00**	**57,811,000.00**
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම	32	**34,000,000.00**	**25,750,000.00**
විශේෂ ව්‍යාපෘතියෙන් ලද ආදායම - වැවිලි කර්මාන්ත අමාත්‍යාශය	33	**-**	**80,817,396.60**
පුහුණු ආදායම්	34	**30,730,118.88**	**23,747,526.82**
නේවාසික පහසුකම් කුලියට දීම තුළින් ලද ආදායම්	35	**2,285,173.00**	**6,365,758.03**
පොලී ආදායම්	36	**10,759,681.90**	**14,744,742.56**
වෙනත් ආදායම්	37	**2,690,434.17**	**1,105,182.27**
මුළු ආදායම		**139,830,407.95**	**210,341,606.28**
වියදම්			
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	38	**45,232,775.83**	**45,139,623.93**
සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතය	39	**4,078,588.14**	**4,114,293.09**
නඩත්තු සහ අළුත්වැඩියා	40	**9,110,072.99**	**8,894,540.43**
සන්නිවේදන සහ උපයෝගීතා සේවා	41	**12,156,814.64**	**12,405,928.82**
පුහුණු වියදම් ධාරිතා සංවර්ධන වැඩසටහන් ද ඇතුළුව	42	**16,319,486.53**	**11,349,815.35**
නේවාසික පහසුකම් කුලියට දීම සඳහා වූ වියදම්	43	**1,602,140.58**	**2,149,739.51**
බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම්	44	**486,959.95**	**1,864,514.71**
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	45	**30,581,718.13**	**26,658,934.23**
වෙනත් වියදම්	46	**1,059,545.03**	**948,348.50**
මුළු වියදම්		**120,628,101.82**	**113,525,738.57**
කාල සීමාවට අදාළ අතිරික්තය / (ඌණතාවය)		**19,202,306.13**	**96,815,867.71**
පාලන අස්තිත්වයේ හිමිකාරීත්වයට අදාළ කොටස		**19,202,306.13**	**96,815,867.71**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මුදල් ප්‍රවාහ ප්‍රකාශය (රුපි.)		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සිදු වූ මුදල් ප්‍රවාහයන්	31/12/2021	31/12/2020
	(රුපි.)	(රුපි.)
වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)	19,202,306.13	96,815,867.71
අඩු කලා පොලී ආදායම	10,867,785.51	14,662,364.15
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	8,334,520.62	82,153,503.56
මුදල් නොවන සංචලනයන්		
ක්ෂය	30,123,204.63	26,135,846.00
ක්‍රමක්ෂය	458,513.50	523,088.23
විශ්‍රාමික පාරිතෝෂිත සඳහා (අධි)/ඌණ වෙන් කිරීම්	(2,765,177.18)	865,923.14
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද (ලාභ)/ අලාභ	(25,481.24)	20,098.82
දේපල පිරියත උපකරණ වලින් සිදුකරන ලද මාරු කිරීම	-	27,278,139.87
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	(34,000,000.00)	(106,567,396.60)
අඩමාණ ණය (අධි)/ඌණ වෙන් කිරීම	-	(215,740.00)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්) / අඩුවීම්	4,045,657.50	3,595,667.76
තොගයන්හි (වැඩිවීම්) / අඩුවීම්	(725,161.10)	(2,212,791.92)
කලින් ගෙවුම් හි (වැඩිවීම්) / අඩුවීම්	13,020,132.58	(9,733,724.54)
අනෙකුත් ජංගම වත්කම් හි (වැඩිවීම්) / අඩුවීම්	11,744,475.11	24,122.25
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම් / (අඩුවීම්)	5,594,981.22	(2,051,537.80)
මූල්‍යමය උපකරණ වල ක්‍රමක්ෂය (ලාභ)/අලාභ	108,103.61	(250,354.60)
සේවක රක්ෂිත තැන්පතු වැඩිවීම් / (අඩුවීම්)	9,031.55	(24,122.25)
කෙට් කාලීන වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්)	(357,110.00)	547,110.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	27,231,170.18	(62,065,671.64)
ආයෝජන ක්‍රියාකාරකම්		

දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(35,150,127.28)	(31,979,265.04)
අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(1,605,150.00)	(1,249,150.00)
වෙනත් ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම	(897,500.00)	
කෙටි කාලීන තැන්පතු වල ආයෝජනය කිරීම	(155,703,078.84)	(17,691,536.65)
තැන්පතු මුදල් බවට පත් කිරීම	155,828,424.70	
භාවිතයට ගත නොහැකි දෑ විකිණීම	53,970.00	-
ණය අත්තිකාරම් ගෙවීම	(3,458,000.00)	(3,544,140.00)
ණය හා අත්තිකාරම් ලැබීම්	3,283,806.60	3,422,054.49
වන්දි මුදල් සඳහා පොලී ලැබීම්	42,594,530.63	
කෙටිකාලීන ආයෝජන මුදල් හා මුදල් සමානදෑ වලට මාරු කිරීම	62,640,030.35	
පොලී ආදායම් ලැබීම	10,786,198.03	18,191,197.57
නව ගොඩනැගිල්ල සහ ඉගෙනුම් මධ්‍යස්ථානය වෙනුවෙන් ආයෝජනය කිරීම	(98,435,102.40)	(59,974,127.48)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(20,061,998.21)	(92,824,967.11)
මූල්‍ය ක්‍රියාකාරකම්		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්	34,000,000.00	21,000,000.00
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රදානයන්	-	60,782,603.40
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් වූ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	34,000,000.00	81,782,603.40
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)	49,503,692.59	13,765,031.70
මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ ආරම්භක ශේෂය	18,557,323.03	4,792,291.33
මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ අවසාන ශේෂය සටහන් 14	68,061,015.62	18,557,323.03

2021 වර්ෂයේ දී මාස **03** ක් වූ කාල සීමාවට අදාලව තැන්පත් කරන ලද කෙටි කාලීන තැන්පතු මුදල් සහ මුදල් සමාන දෑ ලෙස හඳුනා ගෙන ඇත.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය				
ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය				
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා				
ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය				
විස්තරය	දායක වූ ප්‍රාග්ධන	ප්‍රත්‍යාගණන සංචිතය	රදවා ගත් සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය)	මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	35,490,371.21	130,407,699.08	286,299,070.72	452,197,141.01
ප්‍රත්‍යාගණන ඉඩම් ලාභය	-	285,903,961.69		285,903,961.69
2019 වසරේ අතිරික්තය	-	-	105,809,643.40	105,809,643.40
2019.12.31 දිනට ශේෂය	35,490,371.21	416,311,660.77	392,108,714.12	843,910,746.10
ගැලපීම්	-	-	(40,765.80)	(40,765.80)
2020 වසරේ ලාභය	-	-	96,815,867.71	96,815,867.71
2020.12.31 දිනට ශේෂය	35,490,371.21	416,311,660.77	488,883,816.03	940,685,848.01
ඉඩම අත්පත් කර ගැනීමෙන් ලද වන්දි මුදලෙන් ලද පොලිය			42,594,530.63	42,594,530.63
වාහන ප්‍රත්‍යාගණන ලාභය		41,661,503.27		41,661,503.27
බගවන්තලාව ඉඩම ප්‍රත්‍යාගණනය		1,387,500.00		1,387,500.00
2021 වසරේ අතිරික්තය			19,202,306.13	19,202,306.13
2021.12.31 දිනට ශේෂය	35,490,371.21	459,360,664.04	550,680,652.79	1,045,531,688.04

ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් ලද පමා පොලිය මඟින් රඳවා ගත් ලාභය මත සිදු වූ බලපෑම සඳහා වූ ගැලපිලි සටහන

විස්තරය	හර	බැර
ඉඩම් අත්පත් කර ගැනීම නිසා ලද පොලිය	**42,594,530.63**	**-**
2020.12.31 දිනට රඳවා ගත් ඉපයීම් වැඩිවීම	**-**	**42,594,530.63**
රඳවා ගත් ඉපයීම් ගිණුම **31.12.2020** දිනට	**-**	**531,478,346.66**
රඳවා ගත් ඉපයීම් ගිණුම **31.12.2020** දිනට	**-**	**550,680,652.79**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
අයවැය සහ සත්‍ය කාර්ය සාධනය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු. 000)

ආදායම		සත්‍ය (රු: දහස්)	අයවැය (රු: දහස්)	ප්‍රගතිය
රජයේ පුනරාවර්තන ප්‍රදාන	31	59,365	65,000	91%
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම	32	34,000	40,000	85%
පුහුණු ආදායම්	34	30,730	65,700	47%
නේවාසික පහසුකම් කුලියට දීම	35	2,285	15,000	15%
පොලී ආදායම්	36	10,760	11,110	97%
වෙනත් ආදායම්	37	2,690	2,301	117%
මුළු ආදායම්		139,830	199,111	70%
පුනරාවර්තන වියදම්				
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	38	45,233	49,402	92%
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන්	39	4,079	5,511	74%
නඩත්තු සහ අලුත්වැඩියා	40	9,110	9,817	93%
සන්නිවේදන සහ උපයෝගීතා සේවා	41	12,157	15,843	77%
ධාරිතා සංවර්ධන පිරිවැය සමග පුහුණු වියදම්	42	16,319	35,005	47%
පහසුකම් කුලියට දීම සම්බන්ධ වියදම්	43	1,602	7,000	23%
බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම්	44	487	6,158	8%
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	45	30,582	30,000	102%
වෙනත් වියදම්	46	1,060	1,250	85%
මුළු වියදම්		120,628	159,986	75%
ප්‍රාග්ධන වියදම්				
දේපල පිරියත හා උපකරණ		36,755	40,000	92%
මුළු ප්‍රාග්ධන වියදම්		36,755	40,000	92%
මුළු වියදම්		157,383	199,986	79%
භණ්ඩාගාර ප්‍රදාන				
පුනරාවර්තන වියදම්		59,365	60,000	99%
ප්‍රාග්ධන වියදම්		34,000	40,000	85%
මුළු ප්‍රදාන		93,365	100,000	93%

		2021	2020
14	මුදල් හා මුදල් සමාන දෑ	(රු.)	(රු.)
	ජංගම ගිණුම - ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 3697566	5,420,985.27	3,557,323.03
	ඉල්ලුම් තැන්පතු ගිණුම - ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව	62,640,030.35	15,000,000.00
		68,061,015.62	18,557,323.03

15	ලැබිය යුතු දෑ (කෙටි කාලීන)		

15 (අ)	වෙළඳ ලැබිය යුතු දෑ		
	බගවන්තලාව තේ වතු සමාගම	110,500.00	98,500.00
	මධ්‍යම පරිසර අධිකාරිය	3,315.18	18,976.00
	අගලවත්ත වැව්ලි සමාගම	2,000.00	-
	පොල් වගා කිරීමේ මණ්ඩලය		18,000.00
	පොල් සංවර්ධන අධිකාරිය	378,750.00	164,502.50
	පොල් පර්යේෂණ ආයතනය		16,000.00
	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව	270,887.70	
	සිසුන්ගේ පාඨමාලා ගාස්තු	2,908,524.59	2,343,999.50
	වනජීවී දෙපාර්තමේන්තුව		634,172.00
	AMS පුද්ගලික සමාගම	2,000.00	-
	ඇල්කඩුව වැව්ලි සමාගම	58,000.00	58,000.00
	ඇල්පිටිය වැව්ලි සමාගම	430,000.00	655,000.00
	හපුගස්තැන්න වැව්ලි සමාගම		20,000.00
	හැටන් වැව්ලි සමාගම		2,000.00
	මධ්‍යම ඉංජිනේරු උපදේශණ සේවා (පුද්ගලික) සමාගම		201,961.29
	ලංකා ධීවර වරාය සංස්ථාව	12,000.00	
	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	56,000.00	56,000.00

	කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව	35,200.00	65,000.00
	කුරුණෑගල වැවිලි සමාගම		2,000.00
	ලලාන් රබර් සමාගම		22,000.00
	කිරිමැටිය තේ වතු (පුද්) සමාගම	2,000.00	
	මස්කෙලිය වැවිලි සමාගම	12,000.00	12,000.00
	මතුරට වැවිලි සමාගම		270,000.00
	අධ්‍යාපන අමාත්‍යාංශය	8,257,125.00	13,488,810.32
	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - PMMD		8,000.00
	නුකල්ස් වැලි වතු සමාගම	2,000.00	
	ඒ.එල්.එස්. සම්පත් මයා		12,000.00
	රාජ්‍ය වැවිලි සංස්ථාව	6,000.00	
	ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය	18,000.00	
	තේ සහ රබර් රාජ්‍ය අමාත්‍යාංශය	150,000.00	
	ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය	4,000.00	
	වටවල වැවිලි සමාගම	2,000.00	
	බී.බී.එන්. මාරසිංහ මයා	45,000.00	45,000.00
	සී.ටී. මතුගම මයා	45,000.00	45,000.00
	එම්.පී. අමරසිංහ මයා	4,072.30	4,072.30
	නමුණුකුල වැවිලි සමාගම		2,000.00
